# වාර්ෂික වාර්තාව

# 2018

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2019-09-09

ගරු මලික් සමරවික්‍රම
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය,
30 වෙනි මහළ, බටහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

ගරු ඇමතිතුමනි,

<u>වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය - **2018**</u>

**1971** අංක **38** දරණ මුදල් පනතේ **13(2)** වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2018 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සහ පහත සඳහන් ලියකියවිලි ඔබ වෙත සතුටින් පිළිගන්වමි.

- සභාපතිනියගේ වාර්තාව
- ගිණුම් ප්‍රකාශය
- විගණකාධිපතිගේ වාර්තාව

මෙයට- විශ්වාසී

ඉන්දිරා මල්වත්ත
සභාපතිනිය සහ ප්‍රධාන විධායක

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්ය මණ්ඩලය - 2018

| | | |
|---|---|---|
| සභාපතිනිය සහ ප්‍රධාන විධායක | - | ඉන්දිරා මල්වත්ත මිය |
| අධ්‍යක්ෂ ජනරාල් | – | ජේ. සිරිවර්ධන මිය |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන අංශය | – | ඩී . ජයවර්ධන මහතා |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මුදල් හා පාලන අංශය | – | පි. කේ. සුමිත්‍රාරච්චි මිය (18.02.2018 දක්වා) |
| මුදල් අංශය | – | ජී. එම්. හේරත් මෙය අධ්‍යක්ෂිකා |
| මානව සම්පත් කළමණාකරණ අංශය | – | කේ. කේ. ආර්. කන්නංගර මහතා අධ්‍යක්ෂ |
| වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු අංශය | – | එස්. ආර්. පි. ඉන්ද්‍රකීර්ති මහතා අධ්‍යක්ෂ |
| තොරතුරු තාක්ෂණ අංශය | – | අයි. සි. අලහප්පෙරුම මිය අධ්‍යක්ෂිකා |
| කෘෂි අපනයන අංශය | – | පි. වි. ඒ. එම්. බද්දේගමගේ මිය අධ්‍යක්ෂිකා |
| ප්‍රාදේශීය සංවර්ධන අංශය | – | අනෝමා කරලියැද්ද මිය අධ්‍යක්ෂිකා |
| ප්‍රතිපත්ති හා උපායමාර්ගික සැලසුම් අංශය | – | යූ.කේ.ඩි. වැගපිටිය මිය අධ්‍යක්ෂිකා |
| කාර්මික නිෂ්පාදන අංශය | – | සි. දිසානායක මෙය අධ්‍යක්ෂිකා |
| අපනයන සේවා අංශය | – | එම්.කේ. එස්. කේ. මල්දෙනි මහතා අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| අලෙවි සංවර්ධන අංශය | – | **කේ. ඒ. වී. ප්‍රේමතිලක මිය**<br>**අධ්‍යක්ෂිකා** |
| අභ්‍යන්තර විගණන අංශය | – | **නිල්මිණී රණසිංහ මිය**<br>**අභ්‍යන්තර විගණක** |
| නීති අංශය | – | **ඩී.ටී. විජයරත්න මිය**<br>**නීති නිළධාරිනී** |
| විගණකවරු | – | **විගණකාධිපති** |
| බැංකු කරුවන් | – | ලංකා බැංකුව<br>සම්පත් බැංකුව<br>ජාතික සංවර්ධන බැංකුව |

<u>ලියාපදිංචි කාර්යාලය</u>
අංක 42 ,නවම් මාවත
කොළඹ 02.

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2018

| | | | |
|---|---|---|---|
| 01. | ඉන්දිරා මල්වත්ත මිය | - | සභාපතිනිය |
| 02. | ආචාර්ය යූසුෆ් මරික්කාර් මහතා | - | අධ්‍යක්ෂ (ජනවාරි - ඔක්තෝබර් 2018) |
| 03. | බන්දුල එගොඩගේ මහතා | - | අධ්‍යක්ෂ (ජනවාරි - ඔක්තෝබර් 2018) |
| 04. | සනත් ඩි සිල්වා මහතා | - | අධ්‍යක්ෂ (ජනවාරි - ඔක්තෝබර් 2018) |
| 05. | එම්.ජේ.එෆ්. කසීම් මහතා | - | අධ්‍යක්ෂ |
| 06. | රොහාන් අබේකෝන් මහතා | - | අධ්‍යක්ෂ (ජනවාරි - ඔක්තෝබර් 2018) |
| 07. | එස්. එම්. එම්. සලහුදීන් මහතා | - | අධ්‍යක්ෂ (ජනවාරි - ඔක්තෝබර් 2018) |
| 08. | ප්‍රභාෂ් සුබසිංහ මහතා | - | අධ්‍යක්ෂ (2018 දෙසැම්බර් සිට) |
| 09. | ජීවන් ඥානම් මහතා | - | අධ්‍යක්ෂ (2018 දෙසැම්බර් සිට) |
| 10. | ඩී. එස්. වික්‍රමසිංහ මහතා | - | අධ්‍යක්ෂ (2018 දෙසැම්බර් සිට) |
| 11. | එල්.පී. ජයම්පති මහතා | - | ලේකම්<br>වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය |
| 12. | බන්දුල වික්‍රමාරච්චි මහතා | - | ලේකම්<br>ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය<br>(2018 ඔක්තෝබර් දක්වා) |
| 13. | එස්. සේනාරත්න මිය | - | අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම්)<br>කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය<br>(2018 ඔක්තෝබර් දක්වා) |
| 14. | ඩී.වී. බන්දුලසේන මහතා | - | ලේකම්<br>කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය |
| 15. | ඩබ්. ඒ. ඩී. එස්. ගුණසිංහ | - | අතිරේක ලේකම්<br>සංවර්ධන උපායමාර්ග හා විදේශ වෙළඳ අමාත්‍යාංශය |
| 16. | එස්. සේනානායක මහතා | - | අතිරේක ලේකම් (සැලසුම් හා සංවර්ධන)<br>ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>(2018 ඔක්තෝබර් දක්වා) |

| | | | |
|---|---|---|---|
| 17. | යූ. ජී. රත්නසිරි මහතා | - | අතිරේක ලේකම් (ආර්ථික කටයුතු)<br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>(2018 ඔක්තෝබර් දක්වා) |
| 18. | ඩබ්ලිව්. එම්. ඩී. ටී. වික්‍රමසිංහ මිය | | අතිරේක ලේකම් (සංවර්ධන)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| 19. | ආර්. පි. ආරියසිංහ මහතා | | ලේකම්<br>විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 20. | එස්. එන්. බි. කේ. එස්. සේනාරත්න මහතා | | අතිරේක ලේකම් (පරිපාලන හා මානව සම්පත්)<br>ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය අමාත්‍යාංශය |
| 21. | පි.එච්.ඒ.එස්. විජේරත්න මහතා | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br>මුදල් අමාත්‍යාංශය |
| 22. | දුමින්ද ආරියසිංහ මහතා | | අධ්‍යක්ෂ ජනරාල් (හිටපු)<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>(2018 ඔක්තෝබර් දක්වා) |

# පටුන


| | | |
|---|---|---|
| **01** | සභාපතිතුමියගේ පණිවුඩය | 8 |
| **02** | හැඳින්වීම | 9 |
| **03** | 2018 වර්ෂයේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය | 10-36 |
| **04** | 2018.12.31 දිනට ශේෂ පත්‍රය | 37 |
| **05** | 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය | 38 |
| **06** | හිමිකම් ප්‍රකාශය | 39 |
| **07** | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 40 |
| **08** | මූල්‍ය ප්‍රකාශන සටහන් | 41-49 |
| **09** | විගණන වාර්තාව | 50-57 |

## සභාපතිතුමියගේ පණිවුඩය

විවිධ කෝණයන්ගෙන් බලන කල 2018 වසර ශ්‍රී ලංකාවේ අපනයන කර්මාන්තයට සාර්ථක වසරකි. ජාතික අපනයන උපාය මාර්ගික සැලසුම (NES) සම්පාදනය කිරීම මගින්, රටේ අපනයන අංශය නඟා සිටුවීම සඳහා ගෝලීය වෙළඳපල සමඟ සමීප සංකලනයක් ගොඩනගා ගැනීමේ රජයේ ප්‍රයත්නයට බොහෝ සේ පහසුකම් සලස්වන ලදී. දැනට ක්‍රියාත්මක ජාතික අපනයන උපාය මාර්ගික සැලසුම (NES) සාර්ථක ලෙස පිළියෙල කිරීම හා දියත් කිරීම සිදුකරන අතරම අපනයන ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා පියවර ගණනාවක් ගන්නා ලදී.

ආරම්භයේ පටන්ම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එහි දැක්ම වන, රටේ තිරසාර ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කිරීම සඳහා අපනයන සංවර්ධනය, අපනයන විවිධාංගීකරණය, නවෝත්පාදන හඳුන්වාදීම මෙන්ම රැකියා අවස්ථා උත්පාදනය කිරීම ලඟා කර ගැනීම සඳහා පූර්ණ වශයෙන් කැප වී සිටී. ශ්‍රී ලංකාවේ ආයෝජන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මගින් අපනයන ප්‍රවර්ධනය හා අපනයනකරුවන්ට පහසුකම් සැලසීම සඳහා අප නිරන්තර උත්සාහයක නිරත වන්නෙමු.

අප දැනට, නව අපනයන ක්ෂේත්‍ර ගවේෂණය හා පවතින අපනයන ක්ෂේත්‍ර අතරින් මීළඟ මට්ටම දක්වා සංවර්ධනය කිරීම සඳහා සුවිශාල හැකියාවක් පෙන්නුම් කරන තොරතුරු තාක්ෂණය (IT/BPM), ඉදිකිරීම්, අධ්‍යාපනය හා ස්වස්ථතා සංචාරක කර්මාන්තය වැනි උපාය මාර්ගික වශයෙන් වැදගත් අංශ හඳුනා ගැනීමේ කාර්යයේ යෙදී සිටින්නෙමු. එසේම ජාතික අපනයන උපාය මාර්ගික සැලසුමෙහි (NES) වෙළඳාම සඳහා සහාය දීමේ උපාය මාර්ගික සැලස්ම යටතේ නවෝත්පාදනය හා ගෝලීය වෙළඳපල ඉලක්ක කර ගනිමින් ව්‍යවසායකත්වය හැඩ ගැස්වීම සඳහා වන සහායක වැඩසටහන් සකස් කිරීමේ කාර්යයේ නිරතව සිටිමු.

මෙම නව ක්‍රියාමාර්ග මගින් ඉලක්ක ගත විදේශ විනිමය ඉපයීම් සපුරා ගැනීම උදෙසා අපගේ ශක්තීන් උපරිමයෙන් යොදාගැනීම කඩිනම් කෙරේ. පසුගිය වසර තුල ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩළයේ කාර්යසාධනය දෙස ආපසු බලන කල, එය සත්‍ය වශයෙන්ම විදේශ විනිමය ඉපයීම්වල සැලකිය යුතු වේගවත් වර්ධනයක් අත් කර දුන් ඵලදායි වසරක් වේ.

අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍ය තුමාගේ හා අප අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යවරුන්ගේ මඟ පෙන්වීම මෙන්ම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩළයේ කාර්ය මණ්ඩලයේ කැපවීම සමඟින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, දියුණුවේ ගමන් මාර්ගයේ අඛණ්ඩව මෙහෙයවීම සඳහා අවශ්‍ය සෑම මෙවලමක් ම මා සතුව ඇති බව තරයේ විශ්වාස කරමි. අපගේ සම්මානනීය අපනයනකරුවන්ගේ හවුල්කාරීත්වය ඇතිව, ශ්‍රී ලාංකීය අපනයනයන් ඉතා ඉහල සාර්ථකත්වයකට ඔසවා තැබීම සඳහා ආයතනය අනාගතයේදී අනුගමනය කළ යුතු පැහැදිලි මාර්ගයක් සකසා දීමට මම සැලසුම් කරමි.

ඉන්දිරා මල්වත්ත
සභාපතිනිය
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛතම ආයතනය අපනයන සංවර්ධන මණ්ඩලය වේ. එය 1979 අංක 40 දරණ අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලදී. ජාතික අපනයන ඉලක්ක සපුරා ගැනීමෙහිලා උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීමේදී අපනයන සංවර්ධන මණ්ඩලය "ප්‍රතිපත්ති උපදේශක", "අධීක්ෂක", "ප්‍රවර්ධක", "පහසුකම් සපයන්නා" සහ "දැනුම සපයන්නා", යන භූමිකා ඔස්සේ තම කාර්යභාරය ඉටු කරනු ලැබේ.

### දැක්ම

අපනයන සංවර්ධන මණ්ඩලයේ දැක්ම වන "නව නිපැයුම් සහ සේවා" සඳහා ශ්‍රී ලංකාව විශිෂ්ඨ අපනයන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම රජයේ සංවර්ධන ආර්ථික දැක්ම සහ ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්මේ දැක්ම හා මනාව ගැළපේ.

### මෙහෙවර

අපනයන සංවර්ධන මණ්ඩලයේ මෙහෙවර වන නවෝත්පාදනය, ව්‍යවසායකත්වය සහ ගෝලීය ඒකාබද්ධ වීම තුලින් අපනයන තරඟකාරීත්වය මගින් විදේශ විනිමය ඉපැයුම් ඉහල නංවන අතර එමගින් ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් දක්වනු ලැබේ.

### අපනයන සංවර්ධන මණ්ඩලය 2020 සඳහා ප්‍රධාන ප්‍රගති දර්ශක

අ) 2020 වසර වන විට අපනයන ආදායම ඇ.ඩො.බි. 22 දක්වා ඉහළ නැංවීම සහ එමගින් රටේ දළ ජාතික නිෂ්පාදිතයට 20% ක දායකත්වයක් ලබා දීම.

ආ) අධ්‍යාපනය ලත් නිපුණතාවලින් යුතු තරුණ පිරිසට තත්ත්වයෙන් යුතු රැකියා 100,000 ක් නිර්මාණය කිරීම.

ඇ) අපනයන සංවර්ධන මණ්ඩලයේ ස්ථාවර අපනයනකරුවන් 20 කට සහන සලසමින් අපනයන ආදායම ඉහළ නැංවීම.

ඈ) ව්‍යවසායකයින් 200 ක් අපනයන ක්ෂේත්‍රයට එක් කිරීම.

ඉ) ගෝලීය අගය දාමයට සහ ගෝලීය නිෂ්පාදන ජාලයට නව නිෂ්පාදන 4-5 ක් එක් කිරීම.


## 2018 ජනවාරි සිට දෙසැම්බර් කාලසීමාව තුල කාර්යසාධනය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා වන පුමුඛතම රාජ්‍ය ආයතනය වේ. අංක 40 දරණ අපනයන සංවර්ධන පනත යටතේ 1979 දී ස්ථාපනය කරන ලද මණ්ඩලය, ජාතික අපනයන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉටු කරමින් ප්‍රතිපත්ති උපදේශකයෙකු, අධීක්ෂකයෙකු, ප්‍රවර්ධකයෙකු, පහසුකම් සලසන්නෙකු හා දැනුම ලබාදෙන්නෙකු ලෙස රටේ අපනයන අංශයේ ඉමහත් කාර්යභාරයක් ඉටු කරයි.

*"නව නිපැයුම් සහ සේවා සඳහා ශ්‍රී ලංකාව ප්‍රධාන අපනයන කේන්ද්‍රස්ථානයක් ලෙස පිහිටුවීම"* යන අපනයන සංවර්ධන මණ්ඩලයේ දැක්ම, රජයේ සංවර්ධන දැක්ම හා ජාතික අපනයන උපාය මාර්ගික සැලසුම හා සමගාමීවේ.

*"නවෝත්පාදන, ව්‍යවසායකත්ව හා ගෝලීය ඒකාග්‍රතාව තුළින් අපනයන තරගකාරීත්වය තහවුරු කිරීම"* යන අපනයන සංවර්ධන මණ්ඩලයේ මෙහෙවර, විදේශ විනිමය ඉපයීම් වැඩිකිරීම හා එමගින් ජාතික ආර්ථිකයට දායකවීම කෙරෙහි යොමුවී ඇත.

**අපනයන කාර්යසාධනය - 2018**





මූලාශ: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, මණ්ඩලය මගින් සිදුකරන ලද සමීක්ෂණ

සමාලෝචිත වර්ෂය තුල දී වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනය මගින් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපයීම, 2017 වර්ෂයේ අගය වූ ඇ.ඩො.බිලියන 15.1ට සාපේක්ෂව 5.3% ක වර්ධනයක් ලබා ඇත. 2018 වර්සයේ දී අපනයන ඉපැයීම් වල අගය ඇ.ඩො.බිලියන 15.9කි.

පසුගිය වර්ෂයේ වෙළඳ භාණ්ඩ අපනයන අගයවූ ඇ.ඩො .බිලියන 11.4 සමඟ සැසඳීමේදී 2018 වෙළඳ භාණ්ඩ අපනයනය ඉපයීම් ඇ.ඩො.බිලියන 11.9ක් ලෙස වාර්තා කරනු ලැබීය .මෙම කාලසීමාව තුල තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය, සේවා අපනයනය ,ඉදිකිරීම් ,මූල්‍ය සේවා , කාර්ය උපාය(Logistics) සේවා හා ස්වස්ථතා සංචාරක (wellness Tourism) අංශවල 8%ක සමස්ත වර්ධනයක් පෙන්නුම් කරමින් ඇ.ඩො .බිලියන 4.0ක ආදායමක් උපයා ඇත.


තවද 2017 වසරට සමගාමීව 2018 වසරේ මාස හයක් සඳහා වෙළඳ භාණ්ඩ අපනයනය මගින් ඇ.ඩො.බිලියන එකකට වැඩි මාසික ආදායමක් වාර්තා විය. එනම්, මාර්තු (ඇ.ඩො.මිලි.1,107.7),ජුනි (ඇ.ඩො.මිලි.1,024.4),ජුලි (ඇ.ඩො.මිලි.1,037.4),අගෝස්තු (ඇ.ඩො.මිලි.1,055.2) හා දෙසැම්බර් (ඇ.ඩො. මිලි. 1,025) යන මාස වලදීය.




මූලාශ: ශ්‍රී ලංකා මහ බැංකුව හා ශ්‍රී ලංකා රේගුව

තවද නව ජාතික අපනයන උපායමාර්ග යටතේ හඳුනාගත් ඉලක්කගත අංශවල ස්ථාවර කාර්යසාධනයක් ප්‍රත්‍යක්ෂව ඇත .එනම් ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් අපනයනයන් 16.2% කින්ද ආහාර සහ පාන වර්ග අංශය 22.6% කින්ද වර්ධනය වී ඇත. නමුත් කුළුබඩු හා සාන්ද්‍රික ද්‍රව්‍ය මෙන්ම බෝට්ටු නිෂ්පාදනය යන අංශවල ඇණවුම් නිෂ්පාදන අවධියේ පවතින බැවින් ඒවායේ අපනයනයන් පිළිවෙලින් 10.8% හා 50% කින් අඩු වී ඇත.


සමස්ත අපනයනයෙන් 33%ක් සඳහා දායකවන ඇගළුම් අංශය12 ,% බදු සහනයක් සහිත GSP+ ප්‍රතිලාභය හේතුවෙන් යුරෝපීය සංගමය මගින් නව ඇණවුම් ලැබීම නිසා 2018 වසර තුලදී එහි ඉලක්කයෙන් 100% කට වැඩි අගයක් ලඟාකර ගනු ලැබීය .මේ අතරතුර සමස්ත අපනයනයෙන් 5% පමණ වන ටයර් ,අත් වැසුම් ,මෝටර් රථ උපාංග ආදී රබර් නිමි භාණ්ඩ අපනයනය 3.78% කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත.




මූලාශ: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන ගමනාන්ත

අපනයන ගමනාන්තයන් සැලකූ විට, දකුණු ආසියාතික කලාපය සඳහා වන අපනයනය ඇ.ඩො.මිලි.1.097ක අගයක් ලඟාකර ගනිමින් 10.12% ක ප්‍රමාණයකින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත (2017 දී අගය වන ඇ.ඩො.මිලි. 996 හා සැසඳීමේදී). විශේෂයෙන්ම 2017 දී ඇ.ඩො.මිලි. 689.4 වූ ඉන්දියාව වෙත අපනයනයන් 2018 වර්ෂයේදී ඇ.ඩො.මිලි.767.6ක් දක්වා 11.35% කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත. 2017 වසර හා සැසඳීමේදී යුරෝපීය සංගමය වෙත සිදුකල අපනයනයන්ද 5.65% කින් වැඩි වී ඇත. මේ අතරතුර බ්‍රිතාන්‍ය පවුම අවප්‍රමාණවීම හා එක්සත් රාජධානිය යුරෝපීය සංගමයෙන් වෙන්වීම නිසා පාරිභෝගික වෙළඳපලෙහි ඇති වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් එක්සත් රාජධානිය වෙත අපනයනයන් 5.15% කින් විශාල ලෙස අඩු විය.




මූලාශය: ශ්‍රී ලංකා රේගුව

## 1. නව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

*ශ්‍රී ලංකාව සඳහා වන ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම*

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජිනීවාහි ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ සහය ඇතිව 2017 වසරේදී ආරම්භ කරනු ලැබූ ප්‍රධාන ප්‍රතිපත්ති මට්ටමේ ක්‍රියාකාරකම වන්නේ ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම(NES) සම්පාදනය ආරම්භ කිරීම වේ. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයා මෙම කාර්යය සඳහා මූලිකත්වය ගනු ලැබීය.

සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සහ එයට රේඛීය රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ මණ්ඩලවල මඟ පෙන්වීම යටතේ සකස් කරනු ලැබූ සහ අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ශ්‍රී ලංකාව සඳහා වන ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම මගින් ශ්‍රී ලංකාව අපනයන කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීම සහ අපනයනයන් ඊළඟ මට්ටම දක්වා ගෙනයාම අරමුණු කෙරේ. පාර්ශවකරුවන් සමඟ සිදුකරනු ලැබූ සාකච්ඡාවන් ගණනාවකින් අනතුරුව නිමකරනු ලැබූ මෙම සැලැස්ම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව, ගරු අග්‍රාමාත්‍යවරයාගේ අනුග්‍රහය යටතේ 2018, ජූලි මස 19 වැනි දින අරලියගහ මන්දිරයේදී දියත් කරනු ලැබීය.

ශ්‍රී ලංකාව නවෝත්පාදන හා ආයෝජන මගින් මෙහෙයවනු ලබන අපනයන කේන්ද්‍රස්ථානයක් **(SriLanka – An Export Hub)** බවට පත්කිරීම ජාතික අපනයන උපාය මාර්ගික දැක්ම වේ. මෙම උපායමාර්ග මගින් තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය, ස්වස්ථතා සංචාරකකර්මාන්තය, බෝට්ටු නිෂ්පාදනය, කුළුබඩු හා සාන්ද්‍රික නිශ්පාදන, සකස්කරන ලද ආහාර හා පාන වර්ග, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපාංග යන අංශ හය කෙරෙහි අවධානය යොමු කෙරේ. ඊට අමතරව, වෙළඳ තොරතුරු ව්‍යාප්ත කිරීම හා ප්‍රවර්ධනය, ජාතික ගුණාත්මක යටිතල පහසුකම්, නවෝත්පාදනසහ ව්‍යවසායකත්වය, කාර්ය උපායසේවා වෙළඳ සහයක කාර්යයන්ට ඇතුලත් වේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මණ්ඩලය යටතේ ස්ථාපිත උපදේශක සභා හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ජාතික අපනයන උපායමාර්ගික සැලැසුම් අධීක්ෂණ ඒකකයේ සමීප සම්බන්ධතාවය ඇතිව අදාල ක්‍රියාත්මක කිරීමේ ආයතන මගින් මෙම උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

## 2. 2018 ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

සමාලෝචනයට ලක්වන වර්ෂයේදී වෙළඳපල ප්‍රවේශ සහය වැඩසටහන, තොරතුරු තාක්ෂණ වැඩසටහන, ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපාංග අංශය සඳහා බහු ජාතික සහයෝගිතා වැඩසටහන, බෝට්ටු නිෂ්පාදනය - යටිතල පහසුකම් සැලසීම හා නියාමන රාමුව සැකසීම, වෙළඳ ප්‍රවර්ධන වේදිකාවක් ගොඩනැගීම හා "ඇරඹුම" ණය යෝජනා ක්‍රමය යන අයවැය යෝජනා හය ක්‍රියාත්මක කිරීම මණ්ඩලය වෙත පැවරී ඇත.

*<u>වෙළඳපල ප්‍රවේශ සහය වැඩසටහන</u>*

වෙළඳපල ප්‍රවේශ සහය වැඩසටහන යටතේ ඔවුන්ගේ ව්‍යාපාර සංවර්ධන සැලසුම් පදනම් කරගෙන සංවර්ධන හා ප්‍රවර්ධන වැඩසටහන් සිදු කිරීම සඳහා සමාගම් වලට ආධාර කෙරේ. මෙම වැඩසටහන මගින් රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන, විසිතුරු මසුන්, සපත්තු, ලුහු ඉංජිනේරු, පොල් හා පොල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන, මත්ස්‍ය නිෂ්පාදන, ඇඟළුම්, කුළුබඩු හා ඒ හා සමාන නිෂ්පාදන ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ. එය කොළඹ, කළුතර, මහනුවර, පොළොන්නරුව, ගම්පහ, පුත්තලම, කුරුණෑගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක ආවරණය කරමින් ක්‍රියාත්මකවේ. වැඩසටහන පසුගිය වසරේ අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වු බැවින් යන්ත්‍ර මිලදී ගැනීම, නිරෝධායන පහසුකම් ස්ථාපනය කිරීම, ප්‍රමිතිය උසස් කිරීම, ධාරිතා සංවර්ධනය හා වෙළඳපල සංවර්ධනය, තීරු සංකේත පද්ධති ක්‍රියාත්මක කිරිම ආදීය සඳහා පිරිවැය - බෙදා ගැනීමේ පදනම මත සහය ලබා දෙනු ලැබීය.

මෙම වැඩසටහන මගින් සමාගම් පමණක් නොව නිෂ්පාදන පිලිබඳ විශේෂිත වූ සංවිධාන ද ශක්තිමත් කෙරේ.

*<u>තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය කාර්යක්ෂම කරවීම සඳහා මැදිහත් වීම.</u>*

මෙම වැඩසටහන, ප්‍රධාන ක්ෂේත්‍ර හයක් කෙරෙහි අවධානය යොමුකරන අතර 2022 දී ඇ.ඩො.බිලියන 5ක් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වේ. ඒ අතර, **"Champion Builder Initiative"**- එනම්, ඉහල විභවතාවයක් ඇති තොරතුරු තාක්ෂණ සමාගම් වල වර්ධනය වේගවත් කිරීමට හැකි වන හා ශ්‍රී ලංකාව දැනුම් සේවා මූලාශ්‍ර ගමනාන්තයක් බවට පත් කිරීම සඳහා රටේ තත්ත්වය ශක්තිමත් කරනු පිණිස ඩිජිටල් සන්නාමකරණය ක්‍රියාත්මක කිරීම ඇතුලත් වේ. මෙයට අමතරව, රටතුලට හා රටින් පිටතට වන දූත මෙහෙයන් හා ප්‍රදර්ශනය කිරීම් හරහා ඩිජිටල් නොවන සන්නාමකරණය, වෙළඳපල ස්ථානගත කිරීම

පිළිබඳ වාර්තා ආදිය ද ඇතුලත් වේ. ගෝලීය ප්‍රවේශය ප්‍රවර්ධනය කරන අතරම මෙමගින්, මෙම අංශයේ අනාගත නිපුණතා අවශ්‍යතාවය සඳහා සැපයුම වැඩිදියුණු කිරිම, අනාගත නිපුණතා ඉල්ලුම හඳුනාගැනීම මෙන්ම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නවකයන්ගේ අවශ්‍යතා සඳහා විසඳුම් ලබාදීම හා ඉඩපහසුකම් සැපයීම ඉලක්ක කෙරේ. (කලාපීය ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම)

ශ්‍රී ලංකාව ගෝලීය විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීම හා අතිරේක අගය එක් කිරීම අරමුණු කරගනිමින්, ශ්‍රී ලංකාවේ ජාතික තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (ICT/BPM) සන්නාමය, IoI – "Island of Ingenuity" ලෙස 2018 පෙබරවාරි මාසයේදී දියත් කරනු ලැබීය.

*<u>බහු ජාතික සමාගම් ආකර්ෂණය කරගැනීමේ වැඩසටහන</u>*

2018 සිට 2020 දක්වා වන කාල සීමාවේදී ශ්‍රී ලංකාවට බහු ජාතික ගෝලීය ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් සමාගම් (3-5) ආකර්ෂණය කර ගැනීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන සකස් කර ඇත. මෙමගින්, ශ්‍රී ලාංකීය ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් සමාගම් වලට ගෝලීය බහුජාතික සැපයුම් ජාල හා සම්බන්ධ වීම, හවුල් ව්‍යාපාර ඇති කර ගැනීම හා නිර්මාණශීලී කාර්යන් සඳහා ගිවිසුම්ගත නිෂ්පාදකයින් ලෙස නිරත වීමට අවස්ථා උදාකරගැනීම අපේක්ෂා කෙරේ. මෙම කාර්යය පැවරීම සඳහා විශේෂඥයෙකු තෝරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

*<u>බෝට්ටු නිෂ්පාදනය - යටිතල පහසුකම් ඇතිකිරිම හා නියාමන රාමුව වැඩිදියුණු කිරීම.</u>*

බෝට්ටු නිෂ්පාදනය හා නාවුක සංචාරක කර්මාන්තය ලොව පුරා බිලියන ගණනින් මුදල් උපයන කර්මාන්ත වන අතර කලාපයේ අනිකුත් රටවලට පෙර ශ්‍රී ලංකාව මෙම නැගී එන ප්‍රවණතාවයෙහි පූර්ණ ප්‍රතිලාභය ලබාගත යුතුය. අවශ්‍ය යටිතල පහසුකම් හා නියාමනයන් ලබා දෙන්නේ නම් මෙම කර්මාන්තය දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඉහල ප්‍රවණතාවයක් පවතී.

මීටර් 24ට වඩා දිගින් අඩු විවේක/විනෝදාස්වාද බෝට්ටු සඳහා ප්‍රමිතිකරණයක් හා තත්ත්ව සහතික කිරීමේ ක්‍රමවේදයක් නොමැතිකම කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන ප්‍රධාන බාධක වලින් එකක් බව හඳුනා ගෙන ඇත. ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් තිබුණද විවේක/විනෝදාස්වාද බෝට්ටු ලියාපදිංචි කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැත. රටේ ක්‍රියාත්මක මගී බෝට්ටු බොහොමයක් ආරක්ෂක අවශ්‍යතා සපුරා නොමැත. බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය, යාත්‍රා කිරීම හා රටේ නාවුක කටයුතු නියාමනය සඳහාලංකාවේ මුහුදට වැඩියෙන් විදේශීය යාත්‍රා ආකර්ෂණය කර ගැනීම, යාත්‍රා පදනම් වියදම් සමඟ යාත්‍රා සංචාරක කර්මාන්ත සංවර්ධනය හා යාත්‍රා මෙහෙයුම් කිරිම සඳහා උනන්දු කිරිම සඳහා නියාමන රාමුවක් ඇති කිරීම මගින් මෙම වැඩසටහන යටතේ මූලික වශයෙන් මැදිහත් වී ඇත.

ශ්‍රී ලංකාවේ මූලෝපායික පිහිටීම හා දර්ශනීය වෙරළ තීරය හේතුවෙන් ඉතා සුදුසු යාත්‍රා මධ්‍යස්ථානයක් වුවද, යටිතල පහසුකම් හේතුවෙන් යාත්‍රා කිරීම්/ නාවුක ක්‍රියාකාරකම් වල නිරතවීම ඉතා අඩුය.

බෝට්ටු නිෂ්පාදන අංශයට බෝට්ටු නිෂ්පාදන කිරීමේ (විශේෂයෙන්ම මීටර් 20ට වැඩි යාත්‍රා), නවතා තැබීමේ (නැංගුරම් පොලවල්/නිකේතන වරාය), දියත් කිරීමේ හා පරීක්ෂා කිරීමේ (ලිහිසුම් මග/දියත් කිරීමේ ස්ථාන) හා අළුත්වැඩියාවන් සඳහා තටාංගන පහසුකම් නොමැත. මෙම සියල්ල ගෝලීය වෙළඳ පලෙහි තරගකාරිත්වයට බලපාන අතර බෝට්ටු නිෂ්පාදන හා සමුද්‍රිය සංචාරක කර්මාන්තය සඳහා සෘජු විදේශ ආයෝජන හා දේශීය ආයෝජන අඩුවීමට හේතුවේ.

අපනයන සංවර්ධන මණ්ඩලය හා බෝට්ටු නිෂ්පාදන තාක්ෂණ වැඩිදියුණු කිරීමේ ආයතනය (BTI) මගින් කර්මාන්තයේ දැනට යෙදී සිටින්නන්ට අවශ්‍ය යටිතල පහසුකම් ගොඩ නැගීම සඳහා ශක්‍යතාවයක් ඇති ප්‍රදේශයක් ලෙස දකුණු වෙරළබඩ තීරයේ කොග්ගල හා වැලිගම ප්‍රදේශය හඳුනා ගෙන ඇති අතර බෝට්ටු

නිෂ්පාදකයන් සඳහා බෝට්ටු නවතා තැබීම, දියත් කිරීම් හා පරීක්ෂා කිරීමේ පහසුකම් සැලසීමට කප්පරතොට (වැලිගම) දියකඩනයක් ඉදිකිරීමට යෝජනා කර ඇත.

කප්පරතොට (වැලිගම) දියකඩනය ඉදිකිරීම සඳහා වන ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක සැලසුම් සිදු කරමින් පවතී. ශ්‍රී ලංකා බෝට්ටු සංදර්ශණය හා බෝට්ටු පැදීමේ උත්සවය 2018 ඔක්තෝම්බර් මාසයේදී ගාල්ල නගරයේ සාර්ථකව පැවැත්විණි. ශ්‍රී ලාංකීය බෝට්ටු නිෂ්පාදකයින්ට විනෝද යාත්‍රා, ෆෙරි බෝට්ටු, නාවුක යාත්‍රා, භාණ්ඩ ප්‍රවාහන බෝට්ටු, ටැංකි බෝට්ටු, ටැක්සි බෝට්ටුආදීය සඳහා ප්‍රධාන වශයෙන් බුරුන්ඩි රටින් ඇණවුම් ලබා ගැනීමට සමත් වූ අතර නිර්මාණ හා මිල ගණන් පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතී.

*වෙලඳ ප්‍රවර්ධන වේදිකාව (Trade Promotion Portal) සැකසීම.*

තනි රටක් වශයෙන් අපගේ අපනයනයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරිම සඳහා වෙළඳ ප්‍රවර්ධන වැඩපිළිවෙලක් (TPP) ඇති කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. විභව්‍ය හා වත්මන් මිලදී ගන්නන් සඳහා පහසුකම් සැලසීමට හා ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින් සඳහා අදාල පරිදි හා නියමිත වේලාවට වෙළඳ තොරතුරු ලබා ගැනීම සඳහා මෙම වැඩපිළිවෙල සැලසුම් කෙරේ. 2019 මැද භාගයේදී දියත් කරනු ලබන මෙම වැඩපිළිවෙල මගින් e-MARKETPLACE සෘජු මාර්ගගත විකුණුම් තලයක් හරහා හා B2B ගැලපුම් පහසුකම් හරහා සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ප්‍රවර්ධනය වනු ඇත.

*"ඇරඹුම" ණය යෝජනා ක්‍රමය.*

එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ වන ණය යෝජනා ක්‍රමයකි. නවෝත්පාදන ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මුල්‍ය සහය ලබාදීම මගින් වාණිජකරණය හා අපනයන සංවර්ධනය සඳහා තරුණ උපාධිධාරීන්ට ඔවුන්ගේම ව්‍යාපාරයක් ගොඩනගා ගැනීම සඳහා අවස්ථාවක් සපයනු ඇත. ව්‍යාපාර සැලැස්මක්මත පදනම් වූ ශක්‍ය ව්‍යාපාරික අදහස් සඳහා යෝග්‍යතාවය මත මෙම ණය ලබා දෙනු ලැබේ. වයස අවුරුදු 35 ට අඩු විශ්වවිද්‍යාල උපාධිධාරීන්ට හෝ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)5, 6 හා 7 මට්ටමේ සහතිකපත් ලාභීන් සඳහා මෙම ණය ලබාදේ. මේ දක්වා මණ්ඩලය මගින් කෘෂිකර්මාන්තය, භාණ්ඩ නිෂ්පාදනය, තොරතුරු තාක්ෂණය, සංචාරක කර්මාන්තය, සිල්ලර වෙළඳාම ආදි ක්ෂේත්‍රවල අයදුම්පත් 262 ක් අනුමතකර ණය ලබාදීමට සලකා බැලීම සඳහා ලංකා බැංකුව හා මහජන බැංකුව වෙත යොමු කර ඇත.

*උපදේශන සභා.*

ශ්‍රී ලංකාව සඳහා ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නිමි ඇඳුම්, බෝට්ටු හා නැව් නිෂ්පාදනය, පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන, ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපාංග, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, තොරතුරු තාක්ෂණය, ලුහු ඉංජිනේරු විද්‍යාව, සැපයුම් සේවා, ජාතික තත්ත්ව යටිතල පහසුකම්, රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන හා ප්ලාස්ටික්, මුහුදු ආහාර, කුළුබඩු හා ආහාර රසකාරක, වෙළඳ ප්‍රවර්ධන හා වෙළඳ තොරතුරු හා ස්වස්ථතා සංචාරක කර්මාන්තය/ආයුර්වේද අංශය සඳහා නව උපදේශන සභා දහසයක් ස්ථාපනය කර ඇත. පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සහයෝගීතාවය ඇතිව ස්ථාපනය කරන ලද මෙම උපදේශන සභා මගින් තෝරාගත් අපනයන ක්ෂේත්‍ර සඳහා බලපාන ප්‍රධාන ගැටළු හා ඒවායේ කාර්යසාධනය වැඩිදියුණු කිරීමේ අවස්ථා හඳුනා ගැනේ.

## 3. දේශීය ව්‍යවසායකයින්ගේ නව පරම්පරාව බිහි කිරීම.

*නව අපනයනකරුවන් 2000 බිහි කිරීමේ ජාතික වැඩසටහන*

**2017 – 2020** කාලසීමාව තුල නව අපනයනකරුවන් **2000** බිහි කිරීමේ රජයේ ජාතික වැඩසටහන **2017**දී යාපනයෙන් ආරම්භ කරනු ලැබූ අතර, මධ්‍යම පළාත් ව්‍යවසායකයින් සඳහා වන දෙවන වැඩසටහන **2017** දී මහනුවර දී හා දකුණු පළාත් ව්‍යවසායකයින් සඳහා වන තෙවන වැඩසටහන **2018** මැයි මස **11** වන දින මාතර දී පැවැත්විණ. මෙම වැඩසටහන මගින් කුළුබඩු, මැණික් හා ස්වර්ණාභරණ, සකස් කරන ලද ආහාර හා පාන වර්ග, පොල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන හා ධීවර නිෂ්පාදන වැනි අංශ ඉලක්ක කෙරේ. වයඹ ව්‍යවසායකයින් සඳහා වන හතර වැනි දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය **2018** අගෝස්තු මස **17** වන දින කුරුණෑගලදී පවත්වනු ලැබීය. මෙම වැඩසටහන කලාපීය ව්‍යවසායක සංසද වලට අමතරව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ, කුඩා පරිමාණ ප්‍රදර්ශන, දේශීය ප්‍රමුඛ ව්‍යාපාරිකයින් සමඟ පවත්වන වට මේස සාකච්ඡා වලින් සමන්විත විය.

ව්‍යවසායකයින්ගෙන් අයදුම්පත් **1500**ක් පමණ ලැබුණු අතර එයින් සලකා බැලීම සඳහා තෝරා ගත් අයදුම්පත් **516**න් **282**ක් සඳහා වාර්තා සකස් කර ඇත. මෙම වැඩසටහන යටතේ ඍජු අපනයනකරුවන් විසින් ඇ.ඩො.මිලි **3.**කට ආසන්න අගයකින් යුත් අපනයන සිදුකරනු ලැබූ අතර ,වක්‍ර අපනයනකරුවන් විසින් ඇ.ඩො .මිලි **4.4** .ක් පමණ වටිනා අපනයන නිෂ්පාදන සපයනු ලැබීය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ හඳුනාගත් ව්‍යවසායකින් **30** දෙනෙකු සඳහා **2018** ජුනි මස **07** හා **08** යන දිනවල ද යාපනය දිස්ත්‍රික්කයේ ව්‍යවාසයන් **14** දෙනෙකු සඳහා ද **2018** ,අගෝස්තු මාසයේ **13** හා **14** දිනවල දී මහනුවර දිස්ත්‍රික්කයේ ව්‍යවසායකින් **30** දෙනෙකු සඳහා ද අර්න්ස්ට් ඇන්ඩ් යංග් සමාගමේ සහය ඇතිව "ව්‍යාපාරික සැලසුමක් සකස් කරන්නේ කෙසේද?" යන්න පිළිබඳව වැඩමුළු පවත්වනු ලැබීය .මෙම මූලික වැඩමුළු වලට අමතරව ,මණ්ඩලයේ කලාපීය කාර්යාල වල හා සංවර්ධන නිලධාරීන්ගේ සහය ඇතිව ව්‍යවසායකයින් විසින් ඔවුන්ගේ ව්‍යාපාර සැලසුම් සකස් කරනු ලැබීය.

*ජාත්‍යන්තර අපනයන වැඩසටහන.*

**2018** පෙබරවාරි මස **18** වන දින සිට **22** දින දක්වා ඩුබායි හි පැවති "ගල්ෆ් ෆුඩ් **2018**" ප්‍රදර්ශනය සඳහා නිරීක්ෂකයින් ලෙස සහභාගි වීම සඳහා නව අපනයනකරුවන් **2000** වැඩසටහන යටතේ සමාගම් තුනක් සඳහා සහය ලබා දෙනු ලැබීය. මෙමගින් ඔවුන්ට ජාත්‍යන්තර ඉසව්වකට සහභාගි වීමේ අවස්ථාව ලැබුණි. නව අපනයනකරුවන් **2000** වැඩසටහන යටතේ ලියාපදිංචි ආහාර හා පාන වර්ග අංශයේ ශක්‍යතාවයක් ඇති තවත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් **13** දෙනෙකු **2018** මැයි මස **28** දින සිට ජුනි මස **02** දින දක්වා තායිලන්තයේ පැවති වැඩසටහන සඳහා සහභාගි විය. කර්මාන්ත ශාලා නැරඹීම, තායි ඇසුරුම් මධ්‍යස්ථානයේ පැවති පුහුණු වැඩසටහනක් හා "තායිෆෙක්ස්" ප්‍රදර්ශණය නැරඹීම මෙම වැඩසටහනට ඇතුලත් විය. සහභාගිවූවන්ට ඇසුරුම්කරණය හා නිෂ්පාදන වැඩිදියුණු කිරීම පිළිබඳ වටිනා තොරතුරු ලබා ගත හැකි විය.

**2018** සැප්තැම්බර් මස **26** දින සිට ඔක්තෝම්බර් මස **02** දින දක්වා ඉන්දියාවේ මුම්බායි හි පැවති "අන්නාපූරණ" ඉන්දීය ලෝක ආහාර ප්‍රදර්ශනයට සමගාමීව පැවති නිෂ්පාදන ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ හා වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහනට සහභාගිවීම සඳහා ආහාර හා පාන වර්ග කර්මාන්තයේ අපනයනය සූදානම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගෙන් සමන්විත සාමාජිකයන් **10** දෙනෙකුගෙන් යුත් ව්‍යාපාරික දූත කණ්ඩායමක් සඳහා සහය දෙනු ලැබීය. ප්‍රදර්ශනය නැරඹීම, **B2B** සාකච්ඡා මෙන්ම කර්මාන්තශාලා සඳහා සංචාර මෙම වැඩසටහනට ඇතුලත් විය.

අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කරනු ලැබූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සාමාජිකයින් 30 දෙනෙකුගෙන් යුත් දූත කණ්ඩායමක් මගින් චීනයේ ගුඅන්ෂූ නගරයේ දී ඔක්තෝම්බර් මස 10 දින සිට 13 දින දක්වා පැවති 15 වන ජාත්‍යන්තර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රදර්ශනයේ (CISMEF) දී ශ්‍රී ලංකාවේ නිෂ්පාදනයන් මනාව ප්‍රදර්ශනය කරනු ලැබීය. මෙම ප්‍රදර්ශනය මගින් සහභාගිවූ ව්‍යවසායකයින්ට ජාත්‍යන්තර වෙළඳපලෙහි අපේක්ෂිත හවුල්කරුවන් සමඟ සම්බන්ධවීම සඳහා ඵලදායී හා ශක්තිමත් වේදිකාවක් සැපයීය. මෙම ප්‍රදර්ශනය අතරවාරයේදී චීනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් චීන වෙළඳපලට ඇතුලත් වීමට සූදානම් ශ්‍රී ලාංකීය නිෂ්පාදන පිළිබඳ දැනුවත් කිරීම සඳහා 2018 ඔක්තෝම්බර් මාසයේ 17 වන දින වෙළඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කරනු ලැබීය.

උතුරු පළාතේ හඳුනාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අටදෙනෙකු සඳහා 2018 ජනවාරි මාසයේ 26 දින සිට 28 දින දක්වා යාපනයේ පැවති යාපනය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය - 2018 සහභාගි වී ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව සලසා දෙනු ලැබීය. කුඩා හා මධ්‍ය පරිමාණ මුද්‍රණකරුවන් 10 දෙනෙකු සඳහා ඔවුන්ගේ නිෂ්පාදන/සේවා ප්‍රදර්ශනය කිරීමට පහසුකම් සැලසීම සඳහා "Sri Lanka Print 2018" ප්‍රදර්ශනයේ, අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරනු ලැබීය. 2018 මාර්තු මස 15 වන දින කොළඹ පැවති ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ සම්මන්ත්‍රණයට සහභාගිවීම සඳහා සමාගම් දෙකකට අනුග්‍රහය දක්වනු ලැබීය. මොණරාගල පැවති V2025 ප්‍රදර්ශනයේදී ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා සමාගම් දහයක් සඳහා පහසුකම් සලසනු ලැබීය.

2018 මාර්තු මස 15 වන දින හා 16 වන දිනවල යාපනයේ පැවති ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) වෙළඳ පහසුකම් සැලසීම පිළිබඳ වැඩමුළුවට සහභාගිවීම සඳහා සමාගම් 09කට සහය ලබා දෙනු ලැබීය. එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) විසින් සංවිධානය කරනු ලැබූ "තත්ත්ව සහතිකකරණය හා ආහාර සුරක්ෂිතතා ප්‍රමිති හා ආහාර අගය දාම වල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අපනයන තරඟකාරිත්වය වැඩි කිරීම සඳහා පැවතුම්"යන මැයෙන් පවත්වන ලද දැණුවත් කිරීමේ වැඩසටහන සඳහා බස්නාහිර පළාතේ විභව්‍ය සමාගම් 04 ක් සහභාගි විය.

උතුරු හා දකුණු පළාත්වල කොහු ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් හා විභව්‍යතාවයක් ඇති අපනයනකරුවන් වෙනුවෙන්, අපනයන වෙළඳපල සඳහා තත්වයෙන් උසස් කොහු ආශ්‍රිත නිෂ්පාදන සැපයුම් වැඩිදියුණු කිරිම පිලිබඳව හා ජාත්‍යන්තර වෙළඳපලෙහි නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයේ වත්මන් ප්‍රවණතාවය පිළිබඳව දැනුවත් කිරිම සඳහා නෙදර්ලන්තයේ PUM ආයතනය (PUM Netherlands Senior Experts) සමඟ සාකච්ඡා කර තාක්ෂණ පැවරුම් වැඩසටහනක් පවත්වනු ලැබීය.

තාක්ෂණ සහය වැඩසටහන යටතේ මධ්‍යම පළාතේ ආහාර හා පාන වර්ග හා කුළුබඩු සමාගම් 21 කට ISO 9001, ISO 14001, ISO 2200 හා ISO 50001 වැනි ජාත්‍යන්තර ප්‍රමිති සහතිකරණය සඳහා අයඳුම් කිරීමට කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශය හරහා සහය ලබා දෙන ලදී.

*<u>අපනයන වෙළඳපලට කාන්තා ව්‍යවසායකයින්.</u>*

පාවහන් නිෂ්පාදනයේ නියලී කාන්තා ව්‍යවසායකයින් 06දෙනෙකු සඳහා නිර්මාණකරණය පිළිබඳ පුහුණුව ලබා දෙනු ලැබූ අතර 2018 ,පෙබරවාරි මස 02දින සිට 04 දින දක්වා පැවති 2018 පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා සහභාගි වීමට පහසුකම් සලසනු ලැබීය. ඔවුන් විසින් එහිදී රු.මිලි.1 ක අලෙවියක් සිදුකල අතර, DSI, DI බාටා VKC හා වෙනත් සැපයුම්කරුවන්/බෙදාහරින්නන් සමඟ පාවහන් සැපයීම සම්බන්ධයෙන් සාර්ථක ලෙස සාකච්ඡා කරනු ලැබීය. 2018 මාර්තු මස 08 වන දින කාන්තා දිනයට සමගාමීව කාන්තා ව්‍යවසායකයින් 19 දෙනෙකු හා සේවා සංවිධාන 12 ක සහභාගිත්වය ඇතිව අපනයන වෙළඳපල ස්ථාන වැඩසටහනක් පවත්වනු ලැබීය. මෙහිදි කාන්තා ව්‍යවසායකයින් විසින් ඔවුන්ගේ

නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලද අතර ව්‍යවසායකයන්, අපනයන සමාගම් හා සේවා සැපයුම්කරුවන් සඳහා එක් වහලක් යට වෙළඳපල අවස්ථා සම්බන්ධීකරණය සඳහා අවස්ථාව සලසනු ලැබීය. සාමාජිකයින් 05 දෙනෙකුගෙන් යුත් විනිශ්චය මණ්ඩලයක් මගින් හොඳම කාන්තා ව්‍යවසායකයින් තිදෙනා තෝරා පළමු, දෙවන හා තෙවන ස්ථාන සඳහා පිළිවෙලින් රු.300,000/-, රු.200,000/- හා රු.100,000/- බැගින් ඔවුන්ගේ අපනයන අගය එක් කිරීමේ ශක්තිමත් කිරීම සඳහා මූල්‍යමය සහයක් ලබාදෙනු ලැබීය. එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය අනුග්‍රහය සඳහා ද කාන්තා ව්‍යවසායකයින් 07 දෙනෙකු හඳුනා ගෙන තිබේ. ITC හි, "She Trade" වෙබ් අඩවිය සඳහා සමාගම් තුනක් හඳුන්වා දී තිබේ. ITC හි සහය ඇතිව අර්න්ස්ට් ඇන්ඩ් යංග් විසින් කාන්තා ව්‍යවසායකයන් 20 දෙනෙකු සඳහා 2018 මැයි මස 30 වන දින හා 31 දිනවල ව්‍යාපාර සැලසුම් වැඩමුළුවක් පවත්වනු ලැබීය.

*<u>එක ගමක් සඳහා එක නිෂ්පාදනයක් (OVOP) වැඩසටහන හරහා අපනයන සැපයුම් පදනම වැඩිදියුණු කිරීම.</u>*

සමාලෝචනයට ලක්වන කාලසීමාවේදී නුවරගම් පළාතේ නැගෙනහිර වගාකරුවන් 51 දෙනෙකු සඳහා ඉඟුරු හා කහ පිළිබඳ පොකුරු ගොවි සංසදය ඇති කිරීම හා වෙළඳපල හා සම්බන්ධ කිරීමේ වැඩසටහන් සඳහා පහසුකම් සලසනු ලැබීය. විසිතුරු ශාක පත්‍ර වගාකරුවන් සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ සම්මන්ත්‍රණයක්/තාක්ෂණ සැසියක් පවත්වනු ලැබූ අතර, වගාකරුවන් 28 දෙනෙකු අපනයනකරුවන් හා සම්බන්ධ කෙරිණ. මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම්මිරිස් වගාකරුවන් 60 දෙනෙකු හා විසිතුරු ශාක පත්‍ර වගාකරුවන් 40 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් තුනක්ද කෑගල්ල, උඩුනුවර හා දොළුව ප්‍රදේශයේ පුද්ගලයින් 128ක ගේ සහභාගිත්වයෙන් අත්කම් නිර්මාණ හා ස්වභාවික වර්ණ ගැන්වීම පිළිබඳ වැඩසටහනක්ද පැවැත්විණ.

නිලවල අත්කම් නිර්මාණ සංගමයේ හා ලියනවල ස්වර්ණාභාරණ ගම්මානයේ ස්වර්ණාභරණ නිෂ්පාදකයින් 22 දෙනෙකු සඳහා 2018 මාර්තු මස 29 හා 30 යන දෙදින තුල ස්වර්ණාභරණ නිර්මාණකරණය පිළිබඳ වැඩසටහනක් පැවැත්විණි. කුළුබඩු හා ඒ හා සමාන නිෂ්පාදන වගාකරුවන් 120 දෙනෙකු සඳහා සැපයුම් වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්විණ.

*<u>ඇඟළුම් කර්මාන්තය සඳහා ප්‍රතිරූපය ගොඩනැගීමේ වැඩසටහන.</u>*




ඇඟළුම් අපනයනයේ වර්ධනයක් තිබුණද කම්කරු හිඟය හේතුවෙන් කර්මාන්තය අභියෝග ගණනාවකට මුහුණ දී සිටී. මෙම ගැටළුව සඳහා විසඳුම් සෙවීම සඳහා මෙම කර්මාන්තයේ නියැලීමට සේවකයින්ගේ අකමැත්ත ආදී කරුණු මෙන්ම වර්තමානයේ කර්මාන්තය පිළිබද සමාජ දැක්ම අවබෝධ කරගැනීම සඳහා මණ්ඩලය මගින් සමීක්ෂණයක් සිදු කරනු ලැබීය. මෙම සමීක්ෂණයේදී සමාජීය ආකල්ප වෙනස් කිරීමේ අවශ්‍යතාවය මූලික වශයෙන්ම හඳුනාගනු ලැබීය මෙම සමීක්ෂණයේ ප්‍රධාන පාර්ශවකරුවන් වූයේ ප්‍රජා නායකයින්, දිරිගන්වන්නන් හා කර්මාන්තයේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ නොවන නමුත් ජීවනෝපාය සඳහා වෙනත් විකල්ප අපේක්ෂා කරන විභව්‍ය ශ්‍රම බලකායට අයත් පුද්ගලයන් වේ.

මෙම ගැටළුව සඳහා විසඳුම් ලබාදීම සඳහා සමාජයේ හා සුදුසුකම් ඇති කම්කරුවන්ගේ ආකල්ප වෙනස් කිරීම මෙන්ම කර්මාන්තය සඳහා වැඩියෙන් කම්කරුවන් ආකර්ෂණය කර ගන්නා ප්‍රබල ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුමක් සකස් කිරීම සඳහා මහජන සම්බන්ධතා (PR) පිළිබඳ සමාගමකට පැවරීම මඟින් ප්‍රතිරූපය ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීමට යෝජනා විය.

*<u>ප්‍රාදේශීය ස්වර්ණාභරණ නිර්මාණකරුවන්/නිෂ්පාදකයින් සඳහා නිර්මාණ වැඩිදියුණු කිරීමේ වැඩමුළුව</u>*

2016 වර්ෂයේදී මණ්ඩලය මගින් තායිලන්තයේ දී පුහුණුවක් ලබාදෙන ලද දේශීය නිර්මාණ විශේෂඥයින් දෙදෙනෙකුගේ සහය ඇතිව නීලවල හා ලියන්වල අත්කම් ගම්මානවල සමාජිකයින් 16 දෙනෙකු සඳහා මධ්‍යම පළාතේ දී දෙදින වැඩමුළුවක් සංවිධානය කරනු ලැබීය.

## 4. ශ්‍රී ලාංකීය නිෂ්පාදන හා සේවාවන් සඳහා ගෝලීය වෙළඳපල ප්‍රවේශය නිර්මාණ කිරීම

*<u>ආහාර හා පාන වර්ග.</u>*

මණ්ඩලයේ මෙහෙයවීමෙන්, ආහාර හා පාන වර්ග අංශයේ ප්‍රදර්ශකයින් 21 ක් දෙනෙක් හා "2000 නව අපනයන වැඩසටහන මගින් නිරීක්ෂකයින් තිදෙනෙකුගේ සහභාගිත්වය ඇතිව 2018 පෙබරවාරි මස 18 දින සිට 22 දින දක්වා ඩුබායි හි පැවති "Gulfood 2018" ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකාව නියෝජනය කෙරිණ. සයමාසික පසුවිපරමට අනුව, සහභාගී වූ සමාගම් ඇ.ඩො.7.24 ක වටිනාකමකින් යුත් තහවුරුවූ ඇණවුම් ලබා ගැනීමට සමත් වී ඇති අතර ඇ.ඩො. මිලියන 8.69 ක වටිනාකමකින් යුත් ඇණවුම් සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් ඇත. මේ දක්වා ක්‍රියාත්මක කර ඇති ඇණවුම් වල වටිනාකම ඇ.ඩො. මිලියන 3.83 කි.

තේ හා ආහාර පරිපූරක සඳහා නව වෙළඳපල විවෘත වීම, නව තාක්ෂණයන් හඳුනා ගැනීම, බද්ධ ව්‍යාපාර සඳහා අවස්ථාව සැලසීම, සහයෝගී ආයෝජන, නව නිෂ්පාදන හඳුනාගැනීම, නව වෙළඳපල ප්‍රවණතා නිරීක්ෂණය ආදී අංශ තුලින් සහභාගී වූ ප්‍රදර්ශනකරුවන් ප්‍රතිලාභ ලබා ගනු ලැබීය. එසේම ඔවුන්ගේ නිෂ්පාදන හා මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු (MENA) වෙළඳපල සඳහා හඳුන්වා දීමේ අවස්ථාවද සැලසුණි.

සමාගම් කිහිපයකට ඔවුන්ගේ සමාගම් සන්නාමය ජාත්‍යන්තර වෙළඳපළ හඳුන්වා දීමේ අවස්ථාව උදා වූ අතර ඊට සමගාමීව දැනට සිටින හා නව ගැනුම්කරුවන් සමඟ B2B සැසි වාර පවත්වන ලදි.

ශ්‍රී ලාංකීය ආහාර හා පාන වර්ග ප්‍රවර්ධනය සඳහා මණ්ඩලය මගින් 2018 ඔක්තෝම්බර් මස 21 දින සිට 25 දින දක්වා පැරීසියේ පැවති ලෝකයේ විශාලතම නව ආහාර ප්‍රදර්ශනය වන "SIAL France" හිදි ජාතික ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරනු ලැබීය. මෙම ප්‍රදර්ශනයේදී ආහාර හා පාන වර්ග ගණනාවක් ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලාංකීය සමාගම් 14 ක් සහභාගි විය. ප්‍රදර්ශනයට සමගාමීව පොල් නිෂ්පාදන ප්‍රවර්ධනය කරන සමාගම් සඳහා ප්‍රංශයේ ප්‍රමුඛ ගැණුම්කරුවන් සමඟ සාර්ථක ව්‍යාපාර සාකච්ඡා සංවිධානය කරනු ලැබීය. ප්‍රංශයේ ප්‍රධාන පොල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කරන සමාගමක් වන BIO සමාගම කාබනික පොල් ආශ්‍රිත අඩංගු ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. සහභාගිවූවන් සඳහා ඇ.ඩො.285,000 ක වටිනාකමින් යුත් තහවුරු කරන ලද ඇණවුම් ලැබුණි.

*කාබනික ආහාර නිෂ්පාදන.*

ජර්මනියේ **GIZ** හා **IFORM** ආයතනයන් හි සහයෝගිතාවය ඇතිව **2018** පෙබරවාරි මස **14** දින සිට **20** දක්වා සංවිධානය කරනු ලැබූ වෙළඳපල සංවර්ධන වැඩසටහන සඳහා කාබනික ආහාර අංශයේ සමාගම් **6**ක් සහභාගි විය.

සහභාගිවූවන්ට කාබනික නිෂ්පාදන සඳහා ලොව ප්‍රධානම වෙළඳ ප්‍රදර්ශනය වන **"BioFach 2018"** සංචාරය කිරීමට අවස්ථාව ලැබුණි. තවද ඔවුන්ට වැව්ලිකරුවන්, ආනයනකරුවන්, සුපිරි වෙළඳ සැල්, සහතික කරන ආයතන හා නියාමන ආයතන වැනි ජර්මන් කාබනික වෙළඳපලෙහි ප්‍රධාන ක්‍රියාකාරීන් හමුවීමේ අවස්ථාවද උදා විය. සහතික කරන ලද කාබනික ගොවිපල සඳහා සංචාරයේදී ඔවුන්ට ඒකාබද්ධ කාබනික ගොවිපල පද්ධතිය පිළිබඳ හොඳ අත්දැකීමක් ලැබුණි. **"BioFach 2018"** ප්‍රදර්ශනයට මෙන්ම නිෂ්පාදන කර්මාන්තශාලා සහ කාබනික තොග අලෙවි සුපිරි වෙළඳසැල් කරා කල සංචාරයන් මගින්,නව ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීම සඳහා ගැණුම්කරුවන් හමුවීම්, තරඟකාරී රටවල් විසින් ඉදිරිපත් කරන නිෂ්පාදන පිළිබඳව සොයා බැලීම, විවිධ ගමනාන්ත මගින් ආනයනය කරන ලද නිෂ්පාදන වල ගබඩා කිරීම, අගය එකතු කිරිම, පාරිභෝගිකයන් ඉලක්කකර නිෂ්පාදන ස්ථානගත කිරිම හා ඇසුරුම් කිරිම පිළිබඳව මෙන්ම කාබනික අංශය සඳහා වන නව යුරෝපීය සංගමයේ නියාමනයන් පිළිබඳව ද දැනුවත් වීමේ අවස්ථාව ලැබුණි.

*මත්ස්‍ය නිෂ්පාදන.*

නීති විරෝධී, වාර්තා නොවන හා නියාමනය නොකරන ලද (**IUU**) මත්ස්‍ය තහනම ඉවත් කිරිම, **GSP+** සහනය නැවත ලැබීම සමඟම නැවත වතාවක් ශ්‍රී ලංකාව ආසියාවෙන් යුරෝපීය සංගමයේ රටවල් සඳහා අංක එකේ ටූනා අපනයනකරු වෙමින් හා ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදන මූලික ස්ථානයක රඳවා රටට අමතර ආදායමක් ගෙන එමින් තම අපනයන පරිමාව වැඩි කර ගැනීමට හැකිවිය. එම නිසා ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදන කර්මාන්තය සඳහා මෙම ගෝලීය අවස්ථාවන්හි වැදගත්කම සලකා හා **GSP+** සහනයේ සම්පූර්ණ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා මණ්ඩලය මගින් බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර දී **2018** අප්‍රේල් මස **24** දින සිට **26** දින දක්වා පැවති **Seafood Expo Global**ප්‍රදර්ශනය සඳහා (මත්ස්‍ය නිෂ්පාදන අපනයන සමාගම් **9** ක සහභාගිත්වය ඇතිව) ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරනු ලැබීය. ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය සඳහා නරඹන්නන් **1200**ක් ආකර්ෂණය කර ගැනීමට හැකි වූ අතර ප්‍රදර්ශනකරුවන්ට ඇ.ඩො.මිලි. **1.4** ක වටිනාකමකින් යුත් තහවුරු කරන ලද ඇණවුම් ලබා ගැනීමට හැකි වූ අතර, ඇ.ඩො.මිලි.**300,00** පමණ ඇණවුම් සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් තිබේ. ගෝලීය ව්‍යාපාර මූලික සාකච්ඡාවලදී සාකච්ඡා කරන ලද මාතෘකා අතර නිෂ්පාදන වැඩි දියුණු කිරීමේදී නවෝත්පාදන හා වෙළඳපල විභව්‍යතාවයද විය.




**2018** මැයි මස **28** දින සිට **30** දින දක්වා තායිලන්තයේ පැවති ටූනා සම්මන්ත්‍රණය සඳහා සහභාගිවීමට මණ්ඩලය මගින් මත්ස්‍ය නිෂ්පාදන අපනයන සමාගම් තුනක් (**03**) සඳහා සහය දක්වනු ලැබීය. සහභාගිවූවන්ට ගෝලීය ටූනා කර්මාන්තයේ නව ප්‍රවණතා හා වැඩිදියුණු කිරීම් පිළිබඳ දැනුම ලබා ගැනීමට හැකිවිය.

*කුළුබඩු හා සාන්ද්‍රික නිෂ්පාදන.*

**2018 සැප්තැම්බර් මස 09 දින සිට 13 දින දක්වා කොලොම්බියාවේදී පැවැත් වූ IFEAT සමුළුවට සහභාගිවීම සඳහා සමාගම් දෙකකට (02) සහය ලබාදෙනු ලැබූ අතර, එහිදී ඔවුන්ට ගෝලීය නිෂ්පාදකයින් සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමට හැකි විය. සහභාගිවූවන්ට ඇ.ඩො.111,000ක වටිනාකමකින් යුත් සගන්ධ තෙල් සඳහා ඇණවුම් ලැබී ඇති අතර ඇ.ඩො.330,000ක වටිනාකමකින් යුත් ඇණවුම් සම්බන්ධයෙන් සාකච්ඡා සිදුකෙරෙමින් පවතී.**

*මල් වගාව.*

**2018 දෙසැම්බර් මස 04 වන දින අපනයනය සඳහා සජීවී ශාක නිෂ්පාදනය සඳහා තාක්ෂණ පැවරුම් වැඩසටහනක් අපනයන සංවර්ධන මණ්ඩලයේදී පවත්වනු ලැබීය. ජාතික ශාක නිරෝධායන සේවාව (NPQS) හා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව (DNBG) සමඟ සහයෝගීතාවයෙන් පැවති වැඩමුළුව සඳහා ප්‍රතිලාභීන් 100 දෙනෙකු සහභාගි විය. මේ සඳහා අපනයනකරුවන් 2000 වැඩසටහන යටතේ හඳුනාගත් විභව්‍ය අපනයනකරුවන්, කාන්තා ව්‍යවසායකයින්, "ඇරඹුම" ණය යෝජනා ක්‍රමයේ අයදුම්කරුවන්, "සුවහස්" මල් වගාකරුවන් හා ආයෝජකයින් හා කුඩා හා මධ්‍ය පරිමාණ මල් වගාකරුවන් සහභාගි විය. සහභාගිවූවන්ට කර්මාන්තය තුල ඔවුන්ගේ සම්බන්ධතා ජාල පුළුල් කිරීමට හා සජීව ශාක අපනයනයේදී අනුගමනය කල යුතු නිරෝධායන අවශ්‍යතා පිළිබඳ දැනුමක් ලබා ගැනීමටද හැකිවිය.**

***Apparel Sourcing - පැරිස් ,ප්‍රංශය.***

**අපනයන සංවර්ධන මණ්ඩලය මගින් GSP+ ප්‍රතිලාභ උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම හා යුරෝපීය සංගමය සඳහා වන අපනයනයන් වැඩිකිරීමේ ප්‍රයත්නයේදී, යුරෝපීයේ පැවැත්වෙන ප්‍රධානම වෙළඳ ප්‍රදර්ශනය සඳහා දෙවන වරට ද මේ වසරේදී ඇඟළුම් ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය . පැරිසියේ Le Bourget ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ දී 2018 සැප්තැම්බර් මස 17 දින සිට 20 දින දක්වා පැවති මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකීය සමාගම් හයක් සහභාගි විය.**

**මෙහිදී ශ්‍රී ලංකා සම්මන්ත්‍රණයක් පැවැත්වීමට අවස්ථාව උදා වූ අතර එහිදී GSP+ ප්‍රතිලාභ පිළිබඳව හුවා දක්වමින් දෙරට අතර ඇඟළුම් කර්මාන්තයේ වර්ධනයට ඇති අවස්ථාවන් පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලැබීය. ඉතා උසස් ප්‍රමිතිය, ආචාර ධර්මානුකූල නිෂ්පාදනය, ඉක්මනින් වෙළඳපල කරා යොමුකිරීමේ හැකියාව, ශ්‍රී ලංකාවේ පිහිටීම හේතුවෙන් සංවර්ධිත වෙළඳපළ ගණනාවක් සඳහා ඇති සම්බන්ධතාවය පිළිබඳවද අවධානය යොමු කරනු ලැබීය.**

**නැගී එන හා අපේක්ෂා සහගත කර්මාන්ත අංශයක් වන මෝස්තර නිර්මාණකරණය අංශය ප්‍රවර්ධනය කිරීමේ අවස්ථාවද මණ්ඩලය සඳහා හිමි විය. 2017 පැරිසියේ පැවති Apparel Sourcing හිදී මෙම අංශයේ ප්‍රවර්ධනය ආරම්භ විය. 2018 දී මූලික ප්‍රදර්ශනයට සමගාමීව පැවති ශ්‍රී ලංකා විලාසිතා ප්‍රදර්ශනයේදී ශ්‍රී ලාංකීය මෝස්තර නිර්මණකරුවන් දෙදෙනෙකුට ඔවුන්ගේ නිෂ්පාදන හා මෝස්තර, ලේබල්, සන්නාම ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලැබිණ.**

*හොංකොං මෝස්තර නිර්මාණ සතියේ පැවති IFDS හිදී ශ්‍රී ලාංකීය මෝස්තර නිර්මාණකරුවන් ප්‍රවර්ධනය.*

**හොංකොං මෝස්තර නිර්මාණ සතියට සමගාමීව 2018 ජුලි මස 09 වන දින සිට ජුලි මස 12 දින දක්වා පැවති ජාත්‍යන්තර මෝස්තර නිර්මාණ ප්‍රදර්ශනයේදී (IFDS) ශ්‍රී ලාංකීය නිර්මාණකරුවන් හතර දෙනෙකු ඔවුන්ගේ ලේබල හා සන්නාම ප්‍රවර්ධනය කරනු ලැබූ අතර ඔවුන්ට මෝස්තර සංදර්ශනයට සහභාගිවීමේ හා ප්‍රදර්ශනයේදී හමුවූ ගැණුම්කරුවන් සමඟ සබඳතා ගොඩනැගීමේ අවස්ථාව ද හිමි විය. මෙම වැඩසටහන**

මගින් මෝස්තර නිර්මාණකරුවන්ට විවිධ රටවල ගැණුම්කරුවන් හා ඇණවුම් ලබගත හැකි රෙදිපිළි අලෙවිකරුවන් ,උසස් තත්වයේ අත්කම් රෙදිපිළි සැපයුම්කරුවන් මුණගැසීමේ අවස්ථාව සැලසිණ.




මේ සඳහා සහභාගිවීමේ ප්‍රතිඵලයක් ලෙස Pigeon Island සන්නාමය සඳහා හොංකොං හි සිල්ලර ගැණුම්කරුවන්ගෙන් හොඳ ප්‍රතිචාරයක් ලැබුණු අතර, ෂැංහයි POP - UP සිල්ලර වෙළඳසැලෙහි මාසයක කාලයක් සඳහා සන්නාමය ප්‍රවර්ධනය කෙරිණ. මෙය ෂැංහයි වැනි නැගී එන වෙළඳපලක ශ්‍රී ලාංකීය සන්නාමයක් සඳහා ලැබුණු විශිෂ්ඨ අවස්ථාවකි.

*ස්වස්ථතා සංචාරක කර්මාන්තය.*

ඔස්ට්‍රියාවේ ජාත්‍යන්තර ස්වස්ථතා සංචාරක කර්මාන්තයේ විශේෂඥයෙකු වන Dr' Franz Linser ගේ සම්පත් දායකත්ව සම්මන්ත්‍රණයක් 2018 පෙබරවාරි මස 27 වන දින අපනයන සංවර්ධන මණ්ඩලයේ දී පවත්වනු ලැබීය. ආයුර්වේද නිකේතන, ස්පා මධ්‍යස්ථාන, පෞද්ගලික රෝහල්, විදේශ ගමන් සමාගම් හා සංචාරක උපදේශකයන් සමඟ මෙම කර්මාන්තයේ නියැලි රජයේ සේවකයින් සමඟ ආයතනයන්හි පුද්ගලයින් 70 ක් පමණ මේ සඳහා සහභාගි විය. මෙම සම්මන්ත්‍රණයේදී යුරෝපීය කලාපයේ ස්වස්ථතා සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා හා ශ්‍රී ලාංකීය සේවා සැපයුම්කරුවන් සඳහා ඇති අවස්ථා පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරනු ලැබීය. ස්වස්ථතා සංචාරක කර්මාන්තය මූලිකව අවධානය යොමු කලයුතු අංශයක් ලෙස හඳුනාගනු ලැබූ අතර ශ්‍රී ලංකා ජාතික අපනයන උපායමාර්ගික සැලැස්මේ අංගයක් ලෙස මේ සඳහා උපාය මාර්ගයක් වැඩි දියුණු කරනු ලැබීය.

ඉලක්කගත වෙළඳපල තුළ ශ්‍රී ලංකා ස්වස්ථතා සංචාරක කර්මාන්තයේ සන්නාම ප්‍රවර්ධන වැඩසටහනක් ඇති කිරීමට, වසර 03ක පිරිවැය සංරචකයක් හා ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් සහිත විස්තරාත්මක යෝජනාවක් ආචාර්ය ලින්සර් ගෙන් ලබාගනු ලැබීය.

ජාතික අපනයන උපායමාර්ගික සැලැස්මට සමගාමීව මෙම කර්මාන්තය වැඩිදියුණු කිරිම සඳහා මණ්ඩලය විසින් එක්සත් රාජධානියේ ස්වස්ථතා සංචාරක කර්මාන්තයේ විශේෂඥ හා "Wellness Escapes" ආයතනයේ ආරම්භක හා කළමනාකාර අධ්‍යක්ෂ වන Stella Photi මහත්මියට ආරාධනා කරනු ලැබීය. 2018 ඔක්තෝම්බර් මස 31 වන දින අපනයන සංවර්ධන මණ්ඩලයේදී Stella Photi මහත්මියගේ සහභාගිත්වය ඇතිව "ජාත්‍යන්තර ස්වස්ථ සංචාරකයින් සඳහා නිෂ්පාදන ස්ථාන ගත කිරිම හා ආලෙවිකරණය" යන මාතෘකාව යටතේ සමන්ත්‍රණයක් පවත්වනු ලැබීය.

*මැලේසියාවේ හා සිංගප්පූරුවේ දී ශ්‍රී ලාංකීය අපනයනකරුවන් සඳහා ව්‍යාපාර ගැලපීමේ වැඩසටහන.*

ඉලෙක්ට්‍රොනික හා විදුත් අංශයේ අපනයනකරුවන් 6 දෙනෙකු සඳහා 2018 ජුලි මස 16 දින සිට 21 දින දක්වා මැලේසියාවේ හා සිංගප්පූරුවේදී මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබීය. සිංගප්පූරුවේ හා මැලේසියාවේ පවත්වන ලද සෘජු ව්‍යාපාර සාකච්ඡා සඳහා පිළිවෙලින් මැලේසියානු ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් සමාගම් 47 ක් හා සිංගප්පූරු සමාගම් 77ක් සහභාගි විය. ශ්‍රී ලාංකීය සමාගම් සඳහා 28 කට වඩා

වැඩි ව්‍යාපාර අවස්ථා, ව්‍යාපාර සංධාන **15**ක් පමණ සහ තාක්ෂණ හා නවෝත්පාදනයන්හි නව ප්‍රවණතාවයන් පිළිබඳ දැනුම සහ වෙළඳපල නිරාවරණය සමග වූ බද්ධ ව්‍යාපාර අවස්ථා ද ලැබුණි.

*__ශ්‍රී ලංකාවට පැමිණි වෙළඳ දූත කණ්ඩායම්.__*

*මැලේසියාව-* මැලේසියානු නිෂ්පාදකයින්ගේ සන්ධානයේ **(FMM)** සාමාජිකයින් **11** දෙනෙකුගෙන් සමන්විත දූත කණ්ඩායම **2018** ජනවාරි මස **23** දින අපනයන සංවර්ධන මණ්ඩලය වෙත කරන ලද සංචාරයේදී දෙරට අතර අපේක්ෂිත, ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, ආනයන හා අපනයන අවස්ථාවන් පිළිබඳ සාකච්ඡා පැවැත්විණ. **3000** කට වැඩි විවිධ ප්‍රමාණයේ නිෂ්පාදන හා කාර්මික සේවා, සමාගම් නියෝජනය කරන පෞද්ගලික අංශයේ විශාලම ආයතනය වන මෙය මෙම කර්මාන්තයේ නිල වශයෙන් පිළිගත් ඉහලම ආයතනය වේ. ආහාර හා පාන වර්ග, ඇඟළුම්, කාර්යාලීය උපකරණ, සැපයුම් සේවා, ඇසුරුම්කරණය හා ගොඩනැගිලි ද්‍රව්‍ය යන අංශවල ප්‍රමුඛ මැලේසියානු සමාගම් වලින් දූත කණ්ඩායම් සමන්විත විය.

මැලේසියාවේ හා සිංගප්පූරුවේ සාප්පු දාම **30** ක් ඇති මෝස්තර කර්මාන්තයේ සමාගමක් වන **Histyle Apparel Sdn Bhd** ශ්‍රී ලංකාවෙන් ටී-ෂර්ට්, කපු කලිසම්, ජීන්ස් හා බෑග් වැනි නිෂ්පාදන ලබා ගැනීමට කැමැත්තක් දැක්විය. මෙම සමාගම හා ශ්‍රී ලාංකීය ඇඟළුම් අංශයේ සමාගම් සමඟ **B2B** සාකච්ඡා සංවිධානය කරනු ලැබීය.

*ජපානය-* ජපන් බාහිර වෙළඳ සංවිධානය **(JETRO)** විසින් සංවිධානය කරන ලද ජපානයේ **Nagano Prefecture** සේවක සංගමයේ වෙළඳ දූත කණ්ඩායමක් අපනයන සංවර්ධන මණ්ඩලය වෙත පැමිණි අතර එහිදී දෙරට අතර වෙළඳාම වැඩි දියුණු කිරීමේ අවස්ථාව හා හැකියාවන් පිළිබඳව සාකච්ඡා පවත්වන ලදී. මෙම සාකච්ඡාවලදී විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රය, රබර් ආශ්‍රිත නිෂ්පාදන, තේ, පොල් ආශ්‍රිත නිෂ්පාදන, ඉදිකිරීම් හා තොරතුරු තාක්ෂණ ආදී සේවාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. මෙම දූත කණ්ඩායම ආනයන හා අපනයන ව්‍යාපාර මෙන්ම ශ්‍රී ලාංකීය ව්‍යාපාරික ප්‍රජාව සමඟ බද්ධ ව්‍යාපාර හරහා කල හැකි තාක්ෂණ පැවරුම් වැනි ආයෝජන අවස්ථා ආදියද ආරම්භ කිරීමට කැමැත්තක් දැක්වීය.

මණ්ඩලය විසින් **2018** දෙසැම්බර් **3-5** දක්වා දෙවන වරට ජපානය වෙත සංචාරයක් සංවිධානය කරනු ලැබීය. මේ සඳහා ශ්‍රී ලාංකීය ව්‍යාපාරික ප්‍රජාව විශාල උනන්දුවක් දැක්වූ අතර **B2B** සාකච්ඡා **250**කට වැඩි ගණනක් සඳහා සමාගම් **80**කට වැඩි ප්‍රමාණයක් ලියාපදිංචි විය. අපනයන ඉලක්ක කරගත් සමාගම් හා ඒ සඳහා උනන්දුවන සමාගම් සඳහා ජපාන වෙළඳපල පිළිබඳ දැනුම ලබාගැනීමට හා ඔවුන්ගේ ව්‍යාපාරික ජාලය වැඩිදියුණු හා පුළුල් කිරීම සඳහා මෙය අගනා අවස්ථාවක් විය. **B2B** සාකච්ඡාවන්ට අනතුරුව ඇතැම් ගැණුම්කරුවන් කර්මාන්තශාලා වෙත ද සංචාරය කරනු ලැබීය.

*තායිලන්තය -* චෙන්නායි තායි වෙළඳ මධ්‍යස්ථානයේ සහයෝගිතාවය ඇතිව ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලැබූ තායි ජාතික ව්‍යාපාරිකයින් **25**දෙනෙකු විසින් ශ්‍රී ලාංකීය නියෝජිතයින් **52** දෙනෙකු සමඟ **B2B** සාකච්ඡා **100** ක් පවත්වන ලදී.

*පාකිස්ථානය-* පකිස්ථාන් එක්ස්පෝ වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වයෙන් වෙළඳාම සම්බන්ධයෙන් **2017**දී මණ්ඩලය විසින් සිදු කරන ලද පර්යේෂණයට පසුව **2018** අප්‍රේල් මස **26** දින හා **27** දිනවල පාකිස්ථානයේ වෙළඳ දූත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලැබීය. පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ **(PSFTA)** වෙළඳාම උපරිම මට්ටමට ගෙන ඒම කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු විය. කොළඹ හා මාතර දී පැවැත් වූ ව්‍යාපාර සම්මන්ත්‍රණයට හා ශ්‍රී ලංකා - පකිස්ථාන ව්‍යාපාර සංසදය සඳහා සහභාගි වූ දූත කණ්ඩායම ඉන් අනතුරුව ශ්‍රී ලාංකීය අපනයනකරුවන් හමුවීම සඳහා **B2B** සැසි ද පැවැත්විණ. **B2B** සාකච්ඡා අවසානයේදී එක් පකිස්ථාන සමාගමක් විසින් ශ්‍රී ලාංකීය

සමාගමක් හරහා සියඹලා අපනයනය සඳහා ඇණවුමක් ලබා දී ඇති අතර මෙම ඇණවුම අඛන්ඩව ක්‍රියාත්මකවීමට නියමිතය.

එක් පකිස්ථාන සමාගමක් විසින් අනාගත ව්‍යාපාර කටයුතු සඳහා සලකා බැලීමට ශ්‍රී ලාංකීය සමාගමකින් පිරිසිදු පොල් තෙල් සාම්පල ඉල්ලුම් කර ඇත. තවත් පකිස්ථාන සමාගමක් අන්නාසි ජෑම් අපනයනය සමඟ සම්බන්ධ වී සිටී. ඔවුන් විසින් ශ්‍රී ලංකාවේ ශීතාගාර ගබඩා ඒකකයක් හා අයිස්ක්‍රීම් කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI), වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීමේ කාර්යයේ නිරතව සිටී.

තවත් පකිස්ථාන සමාගමක් ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ වෙළඳපල ගවේෂණය සඳහා ශ්‍රී ලාංකීය හවුල්කරුවන් සමඟ සාර්ථක සබඳතා ඇති කර ගැනීමට සමත්ව ඇත. ශ්‍රී ලංකාවෙන් පිරිසිදු පොල් තෙල් ආනයනය කිරීම සම්බන්ධයෙන්ද ඔවුන් උනන්දුවක් දක්වයි. මීට අමතරව පකිස්ථානයේ තේ, කුළුබඩු, පළතුරු, කුරුඳු හා අත්කම් ස්වර්ණාභරණ අපනයනකරුවන් සබඳතා ගොඩනගා ගැනීම සඳහා ශ්‍රී ලාංකීය සමාගම් කරා නියෝජිතයන් එවා ඇත.

දකුණු කොරියාව - 2018 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලාංකීය සමාගම් 10 ක් හා දකුණු කොරියානු මෝටර් රථ උපාංග ගැණුම්කරුවන් සමඟ B2B සාකච්ඡා හා කර්මාන්ත ශාලා සංචාර සංවිධානය කරනු ලැබීය. දූත කණ්ඩායම් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI), ශ්‍රී ලංකා මෝටර් රථ නිෂ්පාදකයින්ගේ සංගමය, ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන නිෂ්පාදකයින්ගේ සංගමය හා වාත්තු සංවර්ධන හා සේවා ආයතනය සමඟද සාකච්ඡා පවත්වනු ලැබීය. සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකීය සමාගමක් විසින් කොරියානු ගැණුම්කරුවන්ගේ අවශ්‍යතාවයන්ට අනුව වැඩිදියුණු කරන ලද සාම්පල ඔවුන්ට යවා ඇත.

*ශ්‍රී ලංකාවේ සංවිධානය කරන ලද වෙළඳ ප්‍රදර්ශන.*

<u>බෝට්ටු සංදර්ශනය හා බෝට්ටු උත්සවය - 2018</u>

සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය, වරාය හා නාවුක අමාත්‍යාංශය, හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහභාගීත්වයෙන්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා බෝට්ටු තැනීමේ තාක්ෂණය වැඩි දියුණු කිරීමේ ආයතනය (BIT) විසින් සංවිධානය කරනු ලැබූ බෝට්ටු සංදර්ශනය හා බෝට්ටු උත්සවය 2018 ඔක්තෝම්බර් මස 26, 27 හා 28 යන දිනවලදී ගාලු කොටුවේ Galle Yatch Marina හිදී පවත්වනු ලැබීය. ප්‍රධාන වශයෙන්ම අපනයනය ඉලක්ක කරගෙන සමුද්‍රිය සංචාරක කර්මාන්තය, විනෝදාස්වාද බෝට්ටු පැදීම, යාත්‍රා කිරීම හා බෝට්ටු සෑදීමේ රටේ හැකියාවන් ප්‍රදර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවත්වන ලද පළමු බෝට්ටු උත්සවය මෙය වේ.

මෙම සංදර්ශනයේදී ජලය මත හා එළිමහන් කුටි 15 ක් ඇතුලු ප්‍රදර්ශන කුටි 55ක් සංවිධානය කරනු ලැබීය . මෙම සංදර්ශනය සඳහා ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මාලදිවයින, ස්වීඩනය, ඉතාලිය






ඇතුළු රටවල විදේශකයින් ඇතුළු නරඹන්නන් 8,000 කට වැඩි පිරිසක් ආකර්ෂණය විය. බුරුන්ඩි , ඕස්ට්‍රේලියාව හා ස්වීඩනය සමඟ ඇණවුම් සම්බන්ධයෙන් සාකච්ඡා සිදු කරමින් පවතී. මාලදිවයින, ස්වීඩන , ඉතාලිය, UAE, ඉන්දියාව, පෝලන්තය, බෙල්ජියම, පකිස්ථානය, සීෂෙල්ස්, මොරිශස් ආදී රටවල් වලින් සංදර්ශනය සඳහා මෙරටට ගැනුම්කරුවන්ගේ දූත කණ්ඩායම් සංචාර සංවිධානය කෙරුණු අතර ශ්‍රී ලාංකීය බෝට්ටු නිපදවන්නන් සමඟ B2B සාකච්ඡා සංවිධානය කරනු ලැබීය. ඔවුන් වෙතින් ධනාත්මක විමසීම් කීපයක්ම ලැබී ඇති අතර, ධීවර බෝට්ටු, කැටමරන් (Catamarans) ආදී බෝට්ටු සඳහා සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. බුරුන්ඩි ජනරජයේ ප්‍රථම උප ජනාධිපති සහ ප්‍රවාහන,පොදු කාර්යයන්, උපකරණ හා භෞමික කළමනාකරණ අමාත්‍යවරයා ආරාධිත අමුත්තන් ලෙස සංදර්ශනයේ ආරම්භක උත්සවයට සහභාගි විය. සාමාජිකයින් 12ක ගෙන් යුත් දූත කණ්ඩායම මගින් ශ්‍රී ලංකා නාවික හමුදාව ඇතුළු ශ්‍රී ලාංකීය බෝට්ටු නිෂ්පාදන සමාගම් සමඟ අනාගත හවුල් ව්‍යාපාර සඳහා සාකච්ඡා කීපයක්ම සිදු කර ඇත.

2018 බෝට්ටු සංදර්ශනය හා බෝට්ටු උත්සවයට සමගාමීව "ශ්‍රී ලංකා - සමුද්‍රීය කර්මාන්තය සඳහා කේන්ද්‍රස්ථානයක්, සමුද්‍ර සංචාරක කර්මාන්තය සඳහා වන අභියෝග හා අවස්ථා" යන මැයෙන් වූ සම්මන්ත්‍රණයක් 2018 ඔක්තෝම්බර් මස 27 වන දින ගාල්ල ජෙට්වින් ලයිට් හවුස් හෝටලයේදී සංවිධානය කරනු ලැබීය. සමුද්‍රිය සංචාරක ගමනාන්තයක් හා බෝට්ටු නිපදවීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පිලිගැනීම නඟාසිටුවීමේ අරමුණ ඇතිව පැවත්වූ මෙම සමුළුවේදී ප්‍රධාන වශයෙන්ම සමුද්‍රිය ධීවර කර්මාන්තය කෙරේ අවධානය යොමු කරනු ලැබීය.

මෙම සමුළුවේදී කීර්තිමත් ජාත්‍යන්තර විශේෂඥයින් වන යුරෝපීය බෝට්ටු කර්මාන්තයේ Ms. Sandrine Devos, Saertex හි ඉන්දීය හා ශ්‍රී ලංකා මිත්‍රත්ව සංසදයේ ආචාර්ය බෝස්, Polboat මහලේකම් මයිකල් බක් මහතා, එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සමුද්‍ර විශේෂඥ මයික් ඩෙරෙට් මහතා හා කර්මාන්තයේ දේශීය විශේෂඥයින් විසින් ඉදිරිපත් කිරීම් කරනු ලැබීය.

<u>කොළඹ පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය 2018</u>

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා කර්මාන්ත මණ්ඩලය (IDB) සමග ශ්‍රී ලංකා පාවහන් හා සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය මගින් දහවන වරට සංවිධානය කරනු ලැබූ පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය, 2018 පෙබරවාරි මස 02 දින සිට 04 දින දක්වා කොළඹ දී පැවැත්විණ.

මෙම ප්‍රදර්ශනය කර්මාන්තයේ සිටින නිර්මාණාත්මක හා ශිල්පීය නිපුණතාවය ඇති දේශීය දක්ෂයින් හඳුනා ගැනීමේ කදිම වේදිකාවක් විය. ප්‍රදර්ශනයේ ප්‍රධාන අරමුණ වූයේ ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවේ පාවහන් හා සම්භාණ්ඩ පිළිබඳ විශිෂ්ඨ ප්‍රතිරූපයක් ගොඩනැගීම වේ. මෙහිදී විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව සැලසිණ.

දේශීය සමාගම් 110ක් හා විදේශීය සමාගම් 23ක් විසින් ප්‍රදර්ශන කුටි 230ක දී ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කරනු ලැබීය. පාවහන් නිෂ්පාදනය කරන කාන්තා ව්‍යවසායකයින් සඳහා මණ්ඩලය මගින් ප්‍රදර්ශන කුටි හයක් සංවිධානය කරනු ලැබීය. නරඹන්නන් 16,000ක් පමණ ආකර්ෂණය කර ගනු ලැබූ මෙම ප්‍රදර්ශනය පැවැත් වූ කාලය තුල රු. මිලියන 50 කට වැඩි අලෙවියක් සිදු කරනු ලැබීය.

ඉතාලි හා ඉන්දීය ජන මාධ්‍යවේදීන් දෙදෙනෙකු ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ අතර ඒ පිලිබඳව Indian Leather හා Style Modainpelle සඟරාවල ප්‍රචාරය සිදුකරනු ලැබීය.

**FACETS, ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය 2018**

ජාතික මැණික් හා ස්වර්භාභරණ අධිකාරියේ හා ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමයේ සහයෝගිතාවය ඇතිව මණ්ඩලය මගින් FACETS ශ්‍රී ලංකා 2018 ප්‍රදර්ශනය සම සංවිධානය කරනු ලැබූ අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයින් 13 දෙනෙකු හා මරදාන ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය, බෙලිඅත්ත තාක්ෂණික විද්‍යාලය හා බෙලිඅත්ත වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් සඳහා මණ්ඩලය මගින් එහි ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරනු ලැබීය.

මෙම තෝරා ගත් කුඩා හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයින්ගේ නිර්මාණ හා නිෂ්පාදනවල තත්ත්වය උසස් කිරීම සඳහා ප්‍රදර්ශනයට පෙර වැඩමුළු 4ක් පවත්වන ලදි. මේ සඳහා සහභාගිවූවන්ට එම ස්ථානයේදී රු.මිලි. 3.3ක අගයකින් යුත් අලෙවියක් මෙන්ම රු. මිලි. 4.0ක වටිනාකමකින් යුත් තහවුරු කරන ලද ඇණවුම් ලබා ගැනීමට හැකි විය.

## 5. අපනයනයකරුවන් ගෝලීය අගය දාමයන් හා ගෝලීය නිෂ්පාදන හුවමාරු කර ගැනීමේ ජාලය සමඟ සම්බන්ධ කිරීම.

*රතු මැටි නිෂ්පාදකයින් සඳහා බෙල්ජියමේ හා ජර්මනියේ තාක්ෂණය හා වෙළඳපල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.*

ජාත්‍යන්තර වෙළඳපලෙහි, විශේෂයෙන්ම යුරෝපීය සංගමයේ පරිසර හිතකාමී නිෂ්පාදනවලට ඇති වැඩිවන ඉල්ලුම සලකා බලා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් උළු කර්මාන්තය ජාත්‍යන්තර වෙළඳපලෙහි ප්‍රවර්ධනය කල හැකි කර්මාන්තයක් ලෙස හඳුනා ගෙන ඇත. එම නිසා රතු මැටි නිෂ්පාදනවල තත්ත්වය උසස් කිරීම සඳහා මණ්ඩලය මගින් නිෂ්පාදන හා වෙළඳපළ වැඩි දියුණු කිරීමේ වැඩසටහන් ගණනාවක් සංවිධානය කරනු ලැබීය.

බෙල්ජියමේ හා ජර්මනියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහය ඇතිව මණ්ඩලය විසින් 2018 අප්‍රේල් මස 09 දින සිට 13වන දින දක්වා රතු මැටි නිෂ්පාදන සඳහා තාක්ෂණික හා වෙළඳපල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වනු ලැබීය. බෙල්ජියමේ ප්‍රධාන පෙලේ රතු මැටි නිෂ්පාදන කර්මාන්ත ශාලා තුනක සංචාරය කිරීම ඇතුලත් මෙම වැඩසටහන සඳහා රතු මැටි නිෂ්පාදනය කරන සමාගම් 09ක් සහභාගි වූ අතර රතු මැටි නිෂ්පාදකයින්ගේ සංගමය ද මුණගැසුණි. ජර්මනියේ CERAMITEC ප්‍රදර්ශනය නැරඹීමට ගිය දූත කණ්ඩායම යුරෝපයේ රතු මැටි කර්මාන්ත සංගමය මගින් සංවිධානය කරනු ලැබූ සම්මන්ත්‍රණයටද සහභාගි විය. සමාගම් සඳහා විශේෂයෙන්ම ගඩොල් හා උළු කර්මාන්තයේ නවීන තාක්ෂණය, නවෝත්පාදන නිෂ්පාදන ස්වයංක්‍රිය ක්‍රියාවලි හා යුරෝපීය යන්ත්‍ර නිෂ්පාදකයින් විසින් වැඩි දියුණු කරන ලද නව යන්ත්‍ර පිළිබඳ විධිමත් අවබෝධයක් ලබා ගත හැකි විය. මෙම සංචාරය සඳහා සහභාගි වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතැම් සමාගම් විසින් කුහර සහිත ගඩොල්, සූර්ය රතු මැටි උළු, ශබ්ද රෝධක ආදි නව නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ සිදු කරනු ලැබේ.

*රථ වාහන උපාංග නිෂ්පාදන කර්මාන්තය.*

SS ජර්මනි සමාගමේ නිෂ්පාදන සංවර්ධන විශේෂඥ මහාචාර්ය පැට්‍රික් කෙලි විසින් 2018 පෙබරවාරි මස 08 දින සිට 06 දින දක්වා නිෂ්පාදන සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන මගින් සහභාගිවූවන්ට ජාත්‍යන්තර අවශ්‍යතා හඳුනා ගැනීමට හා ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලියේ, නිෂ්පාදන තත්ත්වයේ හා ප්‍රමිතියේ, අලෙවිකරණයේ හා විකිණීමේ දුර්වලතා හඳුනා ගැනීමට අවස්ථාව සැලසිණ. සහභාගිවූවන් ඔවුන්ගේ මෙහෙයුම් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හා ඔවුන් නිෂ්පාදනය කරන

මෝටර් රථ සඳහා උපාංග කොටස් සැපයීමට ඇති සහයෝගිතාවය පිළිබඳව සොයා බැලීම සඳහා **Vega Innovation** වැඩපළෙහි ද සංචාරය කරනු ලැබීය.

*<u>බෝට්ටු සහ නැව් ගොඩනැඟීමේ අංශය සඳහා ශක්‍යතා අධ්‍යයනය සහ ආයෝජක සහයෝගිතා වාර්තාව</u>*

බෝට්ටු හා නැව් නිෂ්පාදනය හා ජලතීර සංවර්ධනය සඳහා දේශීය හා විදේශීය ආයෝජකයින් ආකර්ෂණය අරමුණු කර ගනිමින් ආයෝජක සහයෝගිතා වාර්තාවක් හා ශාක්‍යතා වාර්තාවක් සකස් කර තිබේ. සිංගප්පූරුව, ජර්මනිය, නෙදර්ලන්තය, මාලදිවයින, දකුණු අප්‍රිකාව, මොරිශස්, සීෂෙල්ස්, ටැන්සානියා , මැඩගස්කර්, කෙන්යා, උගන්ඩා යන රටවල අපේක්ෂිත ආයෝජකයින් වෙත යොමු කිරීම සඳහා මෙම ආයෝජක සහයෝගිතා වාර්තාව එම රටවල තානාපති කාර්යාල වෙත යවා තිබේ.

## 6. නිදහස් වෙළඳ ගිවිසුම් හා ආර්ථික සහයෝගිතා ගිවිසුම් හරහා වෙළඳපළ ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම.

*<u>සකස් කරන ලද ආහාර.</u>*

***ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර අත්සන් කරන ලද නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) යටතේ වන විධිවිධාන ඵලදායී ලෙස භාවිතා කිරීම.***

ඉන්දියාව ලෝකයේ වේගයෙන්ම දියුණු වන රටවල් වලින් එකක් ලෙස පිලි ගැනේ. ඉන්දියාවේ තීරු බදු නොවන බාධක, ක්‍රමවේදයන්හි ප්‍රමාදයන්, අනුමැතීන් හා නිෂ්කාශන ගැටළු ඉන්දියානු වෙළඳපළ සමඟ ව්‍යාපාර වල යෙදීමේ බාධාවන් ලෙස දැක්විය හැක. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තීරු බදු අඩු කිරිම මගින් වෙළඳපල ප්‍රවේශය ලබා දී ඇති අතර ඉහත දක්වා ඇති තීරු බදු නොවන ගැටළු විසඳීම මගින් නිදහස් වෙළඳ ගිවිසුම්වල උපරිම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වන අවස්ථා තව දුරටත් පුළුල් කල හැක. ඉන්දියාව වෙත අපනයන ප්‍රවර්ධනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ලැබීය.

හදුනාගත් ශ්‍රී ලාංකීය ආහාර හා පාන වර්ග ඉන්දියානු ප්‍රමිතීන්ට අනුකූලව විශ්ලේෂණය කිරීම සඳහා ඉන්දියාවේ ආහාර ආරක්ෂණ හා ප්‍රමිති අධිකාරිය (FSSAI) සමඟ සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකාවේ පරීක්ෂාගාර තුනක් නිර්දේශ කිරීමට කටයුතු කරනු ලැබීය. එම පරීක්ෂාගාර වන්නේ, බියුරෝ වෙරිටාස් කන්සියුමර් පොඩක්ට් සර්විසස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, SGS ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හා කාර්මික තාක්ෂණ ආයතනයයි (ITI).

මෙමගින් අපනයකරුවන්ට මීට පෙර සිදු කල පරිදි සාම්පල පරීක්ෂාවන් සඳහා ඉන්දීය පරීක්ෂණාගාර වලට යැවීමෙන් වැලකී ඉහත ශ්‍රී ලංකාවේ පර්යේෂණාගාර වලදී අනුකූලතා ඇගයීම් සිදු කිරීමේ පහසුකම් සැලසෙනු ඇත.

මණ්ඩලය මගින් ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට ඉන්දීය වෙළඳපළෙහි සම්පූර්ණ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා පහසුකම් සලසමින් ඉන්දියාවේ ආහාර නියාමන පිළිබඳව අපනයකරුවන්/උනන්දුවක් දක්වන ව්‍යවසායකින් දැනුවත් කිරීම සඳහා " ඉන්දියාවේ ආහාර හා පාන වර්ග ආනයන නියෝග හා නිෂ්කාශන ක්‍රියාවලිය" යන මැයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කරනු ලැබීය.

*<u>කුළුබඩු හා සාන්ද්‍රික ද්‍රව්‍ය සඳහා ජපානයේ වෙළඳපල විවිධාංගිකරණය කිරීමේ වැඩසටහන.</u>*

සම්ප්‍රදායික කුළුබඩු වෙළඳපලින් අපගමනයවීම සඳහා හා ආසියාවේ ඉහල අගයක් ඇති වෙළඳපල සඳහා විවිධාංගිකරණය වීම සඳහා සමාගම් 4 ක සහභාගිත්වය ඇතිව 2018 අගෝස්තු මාස 02 වන දින සිට 25

දින දක්වා ජපානයේදී කුළුබඩු හා සාන්ද්‍රික ද්‍රව්‍ය විවිධාංගිකරණය කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

සහභාගිවූවන් කර්මාන්ත ශාලා තුනක් හා පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් වෙත සංචාරය කරන ලදී . ජපාන සමාගම් 55ක් සමඟ පැවති B2B සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස සහභාගි වූ සමාගම්වල කර්මාන්ත ශාලා නැරඹීම සඳහා ජපානයේ සමාගම් දෙකක් පෙරලා ලංකාවට සංචාරය කරනු ලැබීය. ඇ.ඩො 10,000. ක වටිනාකමකින් යුත් ඇණවුම් සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවතී.

*__චීන අන්තර්ජාතික ආනයන අපනයන ප්‍රදර්ශනය (China International Import Expo)__*

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සමාගම් 29 ක් සමගින් 2018 ඔක්තෝම්බර් මස 05-10 දින දක්වා ෂැන්හයි නුවර පැවති චීන අන්තර්ජාතික ආනයන අපනයන ප්‍රදර්ශනයේ ප්‍රථම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කරනු ලැබීය. මෙම ප්‍රදර්ශනය මගින් සහභාගි වූ සමාගම් වලට චීන වෙළඳපලට පිවිසීමේ අගනා අවස්ථාවක් ලබාදෙනු ලැබූ අතර දැනට පවතින වෙළඳපල සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කරනු ලැබීය. සහභාගිවූවන්ට වෙළඳපල ඉල්ලුම, පිළිගැනීම හා තරඟකාරිත්වය පරීක්ෂා කිරීමට ද, නියෝජිතයින් හා බෙදාහරින්නන් හඳුනා ගැනීමට හා පත්කිරීමට ද හැකි වූ අතර සමහරෙක් විසින් වෙළඳපල සඳහා නව නිෂ්පාදන හඳුන්වා දී තිබුණි. සහභාගිවූවන්ට මුල් අදියරේදී ඇ.ඩො251,290.ක වටිනාකමකින් යුත් තහවුරු කරන ලද ඇණවුම් ලබාගැනීමට හැකි වූ අතර වටිනාකම ඇ.ඩො15,852,815 .කින් යුත් ඇණවුම් පිළිබඳව සාකච්ඡා කරමින් පවතී .එසේම සමාගම් ගණනාවක්ම නියෝජිතයින් පත් කිරීමට හා අවබෝධතා ගිවිසුම් සඳහා එළඹීමට සමත් විය.

## 7. ආසියානු රටවල් ඉලක්ක කරගත් වෙළඳපල ප්‍රවේශය

*__ICT/ BPM__*

ජපානයේ JETRO, JISA ආයතන හා තෝකියෝහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගිතාවය ඇතිව මණ්ඩලය මගින් සමාගම් 10 ක් සඳහා 2018 මැයි මස 09 දින සිට 11 දින දක්වා ජපානයේ IT සතියේ දී මෙම වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන සංවිධානය කරනු ලැබීය. මණ්ඩලය මගින් ජපාන වෙළඳපල සඳහා නව සමාගම් හතරක් හඳුන්වා දෙනු ලැබූ අතර, සමාගම් හය දැනටමත් ජපාන වෙළඳපලෙහි ව්‍යාපාරවල නිරත වේ. වැඩසටහන තුළදී ඇතිකරගත් ගිවිසුම් වල වටිනාකම ඇ.ඩො. 500,000ක පරාසයක විය.




තවත් ගිවිසුම් සම්බන්ධයෙන් දැනට සාකච්ඡා කරමින් පවතින අතර ඉදිරි මාස 3-12 දී ඇ.ඩො.1,000,000ක වටිනාකමක් ඇති ස්ථිර වෙළඳ ගනුදෙනු බවට පරිවර්තනය කිරීමට අපේක්ෂිතය. එසේම තවදුරටත් ජපානයේ ව්‍යාපාර පුළුල් කිරීම, ජපානයේ නව ව්‍යාපාර අවස්ථා හඳුනාගැනීම, දකුණු ආසියානු කලාපයේ සළකුණ ශක්තිමත් කිරීම ආදී සමාගම් වල අපේක්ෂිත ප්‍රතිඵල මෙම වැඩසටහන තුලින් සාර්ථක ලෙස ලඟාකරගනු ලැබීය. අපනයනකරුවන් 2000 සංවර්ධන වැඩසටහන හරහා ප්‍රදර්ශනයට සහභාගිවීම සඳහා සමාගම් හතරක් තෝරා ගනු ලැබීය.

එක් සමාගමක් ඔවුන්ගේ නව නිෂ්පාදනය වන **"My Med"** ජපාන වෙළඳපල සඳහා දියත් කරනු ලැබූ අතර තෝකියෝහි කාර්යාලයක් විවෘත කරනු ලැබීය. තවත් සමාගමක් දුරස්ථ ප්‍රදේශවල ප්‍රදර්ශන සඳහා **Virtual Reality** යෙදවුමක් වැඩිදියුණු කිරීම වෙනුවෙන් යෙන් මිලියන **3.2**ක වටිනාකමකින් යුත් ගිවිසුමක් අත්සන් කරන ලදී. වෙනත් සමාගමක් ඩිජිටල් අලෙවි විසඳුමක් නිෂ්පාදනය කිරීම සඳහා ජපානය සමඟ යෙන් **350,000**ක වටිනාකමකින් යුත් ගිවිසුමක් අත්සන් කිරීමට සමත් විය.

***<u>ශ්‍රී ලාංකීය රබර් අත්වැසුම් නිෂ්පාදකයින්/අපනයනකරුවන් සඳහා ඉන්දියාවේ පැවති B2B සාකච්ඡා වැඩසටහන.</u>***

නව දිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සහය ඇතිව මණ්ඩලය මගින් ශ්‍රී ලාංකීය රබර් අත්වැසුම් නිෂ්පාදකයින් හා අපනයනකරුවන් සඳහා **2018** ඔක්තෝම්බර් මස **10** දින සිට **12** දින දක්වා **B2B** සාකච්ඡා වැඩ සටහනක් ඉන්දියාවේ දී සංවිධානය කරනු ලැබීය. එහි වෙළඳපළ අවස්ථා ගවේෂණය අරමුණු කරගත් මෙම වැඩසටහන් සඳහා ඉන්දීය අලෙවිකරණ උපදේශන සමාගමක සේවාව ලබාගත් අතර උතුරු ඉන්දියානු ගැනුම්කරුවන් සමඟ ඍජු සම්බන්ධතා ගොඩ නඟා ගැනීමට විශේෂ අවධානයක් යොමු විය. මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලාංකීය සමාගම් දෙකක් සහභාගි වූ අතර, ගැනුම්කරු සාකච්ඡා **20**ක් සංවිධානය කරනු ලැබීය. මෙම වැඩසටහන අතරතුර ඉන්දියාවේ ප්‍රසිද්ධ රෝහල් දාමයක් වන **M/s Medanta** වෙත සංචාරයක් ද සංවිධානය කරන ලදී.

එක් සමාගමක් සඳහා කාර්මික අත් වැසුම් සඳහා ඇ.ඩො. **28,000**ක තහවුරු වූ ඇණවුම් ලැබී ඇති අතර ඔවුන් විසින් නයිට්‍රයිල් රබර් (***NBR***)/ලේටෙක්ස් අත්වැසුම් සඳහා තවත් ගණුදෙනුකරුවන් හතරදෙනෙකු සමග ඇණවුම් පිළිබඳ කරනු ලබන සාකච්ඡා අවසන් තීරණ අවස්ථාවේ පවතී.

අනෙක් සමාගම අත්වැසුම් සාම්පල යැවීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. තවද මෙම ගැණුම්කරු විසින් වැඩි මිල හා අඩුමිල කාණ්ඩ අතර ඇති විශේෂ අත්වැසුමක් ඉල්ලුම් කර ඇත.

***<u>චීනයේ, Chinaplas 2018 හා සමගාමීව ප්ලාස්ටික් නිෂ්පාදන නිෂ්පාදකයින් සඳහා තාක්ෂණික ගවේෂණ අධ්‍යයන චාරිකාව.</u>***

**2018** අප්‍රේල් මස **24** වන දින සිට **27** දින දක්වා **Chinaplas 2018** ට සමගාමීව ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා අපනයනකරුවන් **10** දෙනෙකුගේ සහභාගිත්වයෙන් තාක්ෂණික ගවේෂණ/අධ්‍යයන චාරිකාවක් සංවිධානය කරනු ලැබීය.

චීනයේ ෂැංහයිහි ජාතික සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ පැවති **Chinaplas 2018** ප්‍රදර්ශනය නැරඹීම, ප්ලාස්ටික් නිපැයුම් යන්ත්‍ර සැපයුම්කරුවන්ගේ කර්මාන්ත ශාලා සංචාරය හා යන්ත්‍ර සැපයුම්කරුවන් හමුවීම මෙම වැඩසටහනට ඇතුලත් විය. උදාහරණ ලෙස ෂෙන්සෙන් හිටොන්වා ප්ලාස්ටික් යන්ත්‍ර කර්මාන්ත ශාලාව, සීමාසහිත නැන්ටොං හුආෂෙන් ප්ලාස්ටික් නිෂ්පාදන සමාගම හා චීනයේ රුයාන් ප්‍රදේශයේ රුයන් වැං හෝර්ං යන්ත්‍රෝපකරණ සමාගම දැක්විය හැක.

වැඩසටහන සඳහා සහභාගි වූ සමාගම් දෙකක් ඇ.ඩො. **58,000** ක වටිනාකමකින් යුත් **60L Blow moulding** යන්ත්‍රයක් හා උසස් තාක්ෂණයෙන් යුත් **6 Color Flexo Press** යන්ත්‍රයක් ඇණවුම් කර ඇත.

සහභාගිවූවන්ට නවීනතම යන්ත්‍ර **(injection moulding, blow moulding** හා **film extrusion** යන්ත්‍ර**)** නව තාක්ෂණයන්, නවෝත්පාදන නිෂ්පාදන, ජෛව ප්ලාස්ටික් ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සඳහා නව සැපයුම්කරුවන්, ප්ලාස්ටික් නිෂ්පාදන සඳහා වන නවීනතම තත්ත්ව ප්‍රමිතීන් හා පරීක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ දැනුම ලබාගත හැකිවිය.

*රබර් කිරි නිෂ්පාදන නිෂ්පාදකයින්/අපනයනකරුවන් සඳහා මැලේසියාවේ තාක්ෂණික පුහුණු හා ගවේෂණ වැඩසටහන.*

මෙම අංශයේ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමේ වැදගත්කම සලකා ජාත්‍යන්තර වෙළඳපලෙහි රබර් කිරි නිෂ්පාදන හා නව තාක්ෂණය පිළිබඳව දැනුම ලබා ගැනීම වෙනුවෙන්, අපනයන සංවර්ධන මණ්ඩලය මගින් 2018 අගෝස්තු මස 27 දින සිට 30 දින දක්වා මැලේසියාවේ Hevea ඇකඩමියේදී තාක්ෂණික පුහුණු වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය. නියෝජිතයින් 12 දෙනෙකුට මෙම වැඩ සටහන සඳහා සහභාගි වීමේ අවස්ථාව ලැබූ. මෙහිදී සහභාගිවූවන් සඳහා රබර් කිරි තාක්ෂණය, රබර් කිරි නිෂ්පාදනය සඳහා නැනෝ ද්‍රව්‍ය යෙදවුම්, විශේෂිත පටික, සෞඛ්‍ය හා සම්බන්ධ ගැටළු, රබර් කිරි නූල් හා ස්ථපිකීකරණය, රබර් කිරි සැකසුම් කිරීමේදී හා නිෂ්පාදනයේදී අපද්‍රව්‍ය කළමනාකරණය, රබර් කිරි තීන්ත හා ඇලවුම් ද්‍රව්‍ය, කෘත්‍රිම රබර් කිරි, ෆෝම් නිෂ්පාදනය කිරීම පිළිබඳව ඉගෙනීමට හැකි වූ අතර එයට පර්යේෂණාගාර සංචාරයක්ද ඇතුලත් විය.



මේ සඳහා සහභාගි වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගම් විසින් නව නිෂ්පාදනවල ආයෝජනය කිරීමේ හැකියාවන් හා නිෂ්පාදන අනුගත කිරීම් පිළිබඳව ගවේෂණය කරමින් සිටී.

*බැංකොක් මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශණය 2018.*

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා තායිලන්තයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගිතාවය හා අපනයනකරුවන් හය (6) දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව 2018 වසරේදී ද දෙවන වරට ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය සංවිධානය කරනු ලැබීය.

සහභාගි වූ සමාගම්වලට ඉතා ඵලදායි වූ මෙම ප්‍රදර්ශනයේදී විශේෂයෙන්ම නිල් මැණික් ඇතුළු පුළුල් පරාසයක ස්වභාවික මැණික් ගල් ප්‍රදර්ශනය කිරීම මගින් ඔවුන්ගේ හැකියාවන් දැක්වීමට හැකි විය. මෙහිදි ඇ.ඩො. 300,000/-ක පමණ මුලු ආදායමක් උපයා ගැනීමට හැකි වූ අතර එක් සහභාගිවූවෙක් සඳහා හොංකොං හි ප්‍රධාන පෙලේ ස්වර්ණාභරණ නිෂ්පාදකයෙකුගෙන් ඇ.ඩො. 8,000/- ක වටිනාකමකින් යුත් අඛණ්ඩ ඇණවුමක් ලැබුණි.

## 8. GSP+ සහනය හරහා උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ වැඩසටහන

*පාවහන් නිෂ්පාදකයින් සඳහා වෙළඳපල නිරාවරණ වැඩසටහන.*

2017 දී ක්‍රියාත්මක කරන ලද නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ වැඩසටහනට පසු විපරමක් ලෙස තෝරා ගත් නිෂ්පාදකයින් හතර දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව 2018 සැප්තැම්බර් මස 25 දින සිට 29 දින දක්වා ඉතාලියේ දී එහි වෙළඳපල සඳහා නිරාවරණයවීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. M/S Style Modainpelle ඇකඩමියේදී මෝස්තර නිර්මාණකරණය හා එහි ප්‍රවණතා පිළිබඳ දින භාගයක සම්මන්ත්‍රණයක් හා යුරෝපීය වෙළඳපල සඳහා නිෂ්පාදන වල යෝග්‍යතාවය පිළිබඳ ඔවුන්ට උපදෙස් ලබාදීම සඳහා අලෙවිකරණ විශේෂඥයින් සමඟ තනි තනි වශයෙන් සාකච්ඡා සිදු කරනු ලැබීය.

සපත්තු නිෂ්පාදන සඳහා වෙළඳපල ඇගයුම් කිරීමේ පැවරුමක් මත, සහභාගිවූවන් මිලාන්හි Lineapelle ප්‍රදර්ශනයට හා මිලාන් වෙළඳ දිස්ත්‍රික්කයට සාංචාරයක් සිදු කරනු ලැබූ අතර, ඔවුන්ට උසස් තාක්ෂණ

ක්‍රමවේද, මෝස්තර, සපත්තු මෝස්තර නිර්මාණය හා අවශ්‍ය කරන තත්ත්ව ප්‍රමිතිය ලබා ගැනීම සඳහා සැලකිය යුතු ප්‍රවණතා පිළිබඳව දැනුමක් ලබා ගැනීමට හැකි විය. සහභාගිවූවන්ට අවම යන්ත්‍ර හා මානව සම්පත් යෙදවුමකින් ඉහල ප්‍රමිතියෙන් හා ඵලදායිතාවයෙන් යුතුව කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන්නේ කෙසේද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි විය.

මණ්ඩලය මගින් ක්‍රියාත්මක 2000 නව අපනයනකරුවන් වැඩසටහන හා කාන්තා ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන යටතේ ලියාපදිංචි, තෝරා ගත් කුඩා හා මධ්‍ය පරිමාණ පාවහන් නිෂ්පාදකයින් 15 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සඳහා, 2018 දෙසැම්බර් මස 10 වන දින අපනයන සංවර්ධන මණ්ඩලයේදී ඉහත වැඩසටහන සඳහා සහභාගිවූවන් සමඟ දැනුම බෙදා ගැනීමේ සැසියක් පවත්වනු ලැබීය.

*නෙදර්ලන්තය, බෙල්ජියම හා ලක්සම්බර්ග් කරා රටින් පිටත දූත මෙහෙයන්.*

ඇඟළුම්, මත්ස්‍ය නිෂ්පාදන, තොරතුරු තාක්ෂණ, තේ, ඖෂධීය පැළෑටි නිෂ්පාදන, හා ස්වස්ථතා සංචාරක කර්මාන්තය යන අංශවල සමාගම් දහනවයක් මෙම වැඩසටහන සඳහා සහභාගි විය. ශ්‍රී ලාංකීය සමාගම් සඳහා නෙදර්ලන්තයේ, බෙල්ජියමේ හා ලක්සම්බර්ග් හිදී B2B සාකච්ඡා හැටක් (60) සංවිධානය කරනු ලැබීය. ඇගළුම් අංශයේ සමාගම්, ලොව පුරා ඇගළුම් සඳහා වන ස්ථිර ප්‍රදර්ශන හා ව්‍යාපාර සිට ව්‍යාපාර දක්වා වේදිකාවක් වන Trade Mart Belgium හි සංචාරය කරනු ලැබීය. Trade Mart විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව ශ්‍රී ලාංකීය ඇගළුම් සමාගම් (05) ක් මගින් ශ්‍රී ලාංකීය ඇගළුම් ප්‍රදර්ශනය කිරිම හා ප්‍රවර්ධනය සඳහා Trade Mart වර්ග මීටර් 1500 ක ස්ථිර ඉඩ ප්‍රමාණයක් සඳහා අයදුම් කර තිබේ.

ලක්සම්බර්ග් හිදී පවත්වනු ලැබූ ව්‍යාපාරික සාකච්ඡා වලින් පසුව, යුරෝපයේ මූල්‍ය සේවා කර්මාන්තය සඳහා මෘදුකාංග විසඳුම් වැඩි දියුණු කිරීමේ ප්‍රධාන ආයතනය වන ලක්සම්බර්ග් හි පිහිටි "House of Fintec" හි ශ්‍රී ලාංකීය කාර්යාලයක් විවෘත කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ආයතනයක් දෙවන වරටද එරට සංචාරයක නිරත විය.

ඔවුන් විසින් ලෝකයට ඉලෙක්ට්‍රොනික ගෙවීම් මෘදුකාංග විසඳුම් ලබාදීමේ ප්‍රධාන ආයතනය වන බෙල්ජියමේ Bancontact ආයතනය සමඟ දේශ සීමා හරහා ගෙවීම් කිරීමේ හවුල්කාර ගිවිසුමකට ද ඇතුලත්ව ඇත.

ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 1.2 වටිනාකමකින් යුත් මත්ස්‍ය ආහාර අංශයේ ඇණවුම් පහක් (05), ඇගළුම් අංශයේ ඇණවුම් හයක් (06) හා ස්වස්ථතා සංචාර අංශයේ ඇණවුම් හතරක් (04) සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවතී.

*ලෝක අපනයන සංවර්ධන සංසදය.*

අප්‍රිකානු කලාපයේ ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ඇති අවස්ථාවන් පිළිබඳව සොයා බැලීමේ වැදගත්කම සලකා, මණ්ඩලය මගින් සැප්තැම්බර් මස 10 දින සිට 12 දින දක්වා සැම්බියාවේ ලුසාකා හිදී පැවැත් වූ ලෝක අපනයන සංවර්ධන සංසදය සඳහා සහභාගි වීම සඳහා පෞද්ගලික අංශයේ අපනයන සමාගම් 6 කින් සමන්විත වෙළඳ දූත කණ්ඩායමක් සංවිධානය කරනු ලැබූ අතර, 2018 සැප්තැම්බර් මස 05 -07 දක්වා කෙන්යාවේදී ව්‍යාපාරික සාකච්ඡා පවත්වනු ලැබීය.

ව්‍යාපාර සංසදයට පසුව කෙන්යාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ හවුල්කාරිත්වයෙන් කෙන්යානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (KNECI) හා කෙන්යානු නිෂ්පාදකයින්ගේ සංගමය (KMA) මගින් 2018 සැප්තැම්බර් මස 05 වන දින ශ්‍රී ලාංකීය දූත කණ්ඩායම සඳහා B2B සාකච්ඡා සංවිධානය කරනු ලැබීය. මෙම වැඩ සටහනෙහි ප්‍රතිඵලයක් ලෙස රස කැවිලි, සකස් කරන ලද ආහාර හා

පොල් නිෂ්පාදන අංශ සඳහා වන ඇණවුම් 05 ක් සාකච්ඡා මට්ටමේ පවතී. ඉංජිනේරු අංශයේ හා ස්වස්ථතා සංචාරක අංශයේ බද්ධ ව්‍යාපාර 02 ක් ආරම්භ කිරීම සඳහා සාකච්ඡා කරමින් පවතී.

දූත කණ්ඩායම සැප්තැම්බර් මස 10 – 12 දක්වා සැම්බියාවේ පැවති ලෝක අපනයන සංවර්ධන සංසදය (WEDF) හා ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) මගින් සංවිධානය කරනු ලැබූ B2B සාකච්ඡා සඳහා සහභාගි විය.

## 9. ශ්‍රී ලංකාව සන්නාමකරණය හා ශ්‍රී ලාංකීය නිෂ්පාදන ගෝලීයව ස්ථානගත කිරීම

*කුළුබඩු සන්නාමකරණය.*

ලංකාවේ කුළුබඩු ජාත්‍යන්තර වෙළඳපළෙහි ස්ථානගත කිරීම සඳහා මණ්ඩලය මගින් ශ්‍රී ලාංකීය කුළුබඩු, විශේෂයෙන්ම කුරුඳු හා ගම්මිරිස් සඳහා සන්නාම ප්‍රවර්ධන වැඩ සටහනක් ආරම්භ කර තිබේ. ප්‍රමුඛ සන්නාම උපදේශන සමාගමක සහය ඇතිව මණ්ඩලය මගින් සන්නාමකරණ උපාය මාර්ග, සන්නිවේදන නිර්දේශ හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබීය. මෙම කාර්යය සාර්ථක ලෙස නිම කිරීම සඳහා ව්‍යාපෘතිය පිළිබඳව උපදෙස් ලබා දීමට මණ්ඩලය මගින් රාජ්‍ය හා පෞද්ගලික අංශවල සාමාජිකයින්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කරනු ලැබීය. එම සාමාජිකයින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, කුළුබඩු කවුන්සිලය, කුළුබඩු හා ඒ හා සමාන නිෂ්පාදන නිපදවන්නන්ගේ හා වෙළඳුන්ගේ සංගමය, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය, කුරුඳු පුහුණු ඇකඩමිය, වැවිලි කර්මාන්තය, ආදි ආයතන වල නියෝජිතයින් හා සැකසුම් කරුවන්/අපනයනකරුවන්ගෙන් සමන්විත විය.

අදාළ පාර්ශව කරුවන් හා මෙහෙයුම් කමිටු සාමාජිකයින් සමඟ අපනයන සංවර්ධන මණ්ඩලයේදී වැඩමුළු කීපයක් පවත්වනු ලැබීය. ලොව ප්‍රසිද්ධ සන්නාමකරණ සමාගමක් වන Interbrand ආයතනයේ උපායමාර්ග අධ්‍යක්ෂ Guido Van Gardan මහතා විසින් මණ්ඩලයේදී පවත්වන ලද සන්නාම ස්ථාන ගත කිරීමේ වැඩමුළුවක් මෙයට ඇතුලත් විය.

ඒ අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලය මගින් කුළුබඩු සන්නාමකරණය නිම කරනු ලැබීය. ලංකා කුළුබඩු සන්නාමකරණය "Born in Sri Lanka" යන උද්‍යෝග පාඨය හා පොදු සලකුණක් යටතේ සිදු කරනු ඇත.

*ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශක.*

ලංකාවේ කුරුඳු සඳහා යුරෝපීය සංගමයේ භූගෝලීය දර්ශක (GI) ලබා ගැනීම සඳහා මණ්ඩලය කුරුඳු කර්මාන්තයේ පාර්ශවකරුවන් සමඟ කටයුතු කරමින් සිටී. අපනයන සංවර්ධන මණ්ඩලය, UNIDO ආයතනයේ සම්බන්ධීකරණය ඇතිව ලංකා කුරුඳු භූගෝලීය දර්ශකය (GI) අයදුම් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට හා කුරුඳු සම්භවය තහවුරු කිරීමේ පද්ධතියක් ගොඩනැගීම සඳහා මාර්ගෝපදේශ ලබා ගැනීමට ජාත්‍යන්තර විශේෂඥයෙකු බඳවා ගනු ලැබීය.

මණ්ඩලය මගින් හඳුනාගත් නිෂ්පාදන, එනම් කැපූ කුරුඳු පොතු, කුඩු, කුරුඳු කොළ තෙල් හා කුරුඳු පොතු තෙල් සඳහා යුරෝපීය සංගමයේ භූගෝලීය දර්ශක ලබා ගැනීමේ තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ හා පෞද්ගලික අංශයේ කුරුඳු පාර්ශවකරුවන් සමඟ "ලංකා කුරුඳු සඳහා පිරිවිතර" ද සකස් කර ඇත.

මණ්ඩලය මගින් ගාල්ල, මාතර, කළුතර, රත්නපුරය හා හම්බන්තොට දිස්ත්‍රික්කවල වැවිලිකරුවන්, නිෂ්පාදකයින්, වෙළඳුන් හා අපනයනකරුවන් ඇතුළු කුරුඳු කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා කුරුඳු භූගෝලීය දර්ශක පිරිවිතර වල දක්වා ඇති පරිදි නිෂ්පාදනයේ යෙදෙන සාමාජිකයන් අධීක්ෂණය කිරීම

සඳහා අභ්‍යන්තර පාලන යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරනු ලබන "භූගෝලීය දර්ශක සංගමය" ස්ථාපනය කිරීමට මූලිකව සහය දෙනු ලැබීය.

ඉහත සඳහන් කුරුඳු සැකසුම් කරන දිස්ත්‍රික්ක 05 නියෝජනය කරන හා ඉන් බිහි වූ භූගෝලීය දර්ශක සංගමයේ සාමාජිකයින් හා කුරුඳු භූගෝලීය දර්ශක පිරිවිතර දක්වා ඇති පරිදි මූලික පිරිවිතර පවත්වාගෙන යනු ලබන කුරුඳු නිෂ්පාදකයින් **"Ceylon Cinnamon"** හා **"GI සලකුණ"** භාවිතා කර ඔවුන්ගේ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා සුදුසුකම් ලබනු ඇත.

*<u>ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් අංශය.</u>*

ශ්‍රී ලංකා විදේශ දූත කණ්ඩායම් හා සමාජ මාධ්‍ය හරහා ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය ඩිජිටල් අලෙවිකරණ මාධ්‍ය වැඩසටහනක් සකස් කර ප්‍රචාරය කරනු ලැබීය. එය අපනයන සංවර්ධන මණ්ඩල වෙබ් අඩවිය හා යූ ටියුබ් හරහා ලබා ගත හැක.

*<u>ජාතික තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය (ICT/BPM)</u>*

අපනයන සංවර්ධන මණ්ඩලය මගින් එහි පාර්ශවකරුවන් සමඟ 2015 පෙබරවාරි මස 15 වන දින බණ්ඩාරණායක සම්මන්ත්‍රන ශාලාවේ දී, **"IOI – Island of Ingenuity, Sri Lanka Knowledge Solutions "**යන ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ අංශයේ ජාතික සන්නාමය දියත් කරනු ලැබීය. ජපාන අරමුදල මගින් මූල්‍ය හා තාක්ෂණික සහය ලබා ගනු ලැබූ අතර **PwC** සමාගම උපදේශකයින් ලෙස කටයුතු කරනු ලැබීය.

වැඩි වටිනාකමක් එක් කිරීම හා ගෝලීය වශයෙන් තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ විශිෂ්ඨතා කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීමේ අවශ්‍යතාවය සඳහා තොරතුරු තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ කර්මාන්තය සඳහා ශක්තිමත් සන්නාමයක් හඳුනාගනු ලැබූ අවස්ථාවක මෙම දියත්කිරීම ඉතා වැදගත් වේ.

## 10. වෙළඳාම සඳහා පහසුකම් සැලසීම හා වෙළඳ තොරතුරු

*<u>අපනයනකරුවන්ගේ සංසද.</u>*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ සහයෝගීතාවය ඇතිව මණ්ඩලය මගින් 2018 දී අපනයනකරුවන්ගේ සංසද හතරක් පවත්වනු ලැබීය. අප්‍රේල් මස 05, ජූනි මස 22, අගෝස්තු මස 14, ඔක්තෝම්බර් මස 16 යන දිනයන් හිදි මෙම සංසද පවත්වනු ලැබීය.

මෙම සංසද මගින්, විවිධ කර්මාන්ත අංශයන් නියෝජනය කරන අපනයකරුවන්ට ඒ සඳහා අදාල රජයේ ආයතන සමඟ සම්බන්ධ වී වෙළඳාම හා සම්බන්ධ ගැටළු වලදී ඔවුන්ගේ සහය ලබාගැනීම සඳහා අවස්ථාව උදා කර දෙනු ලැබීය.

සහභාගී වූ අදාළ රාජ්‍ය ආයතන හා පෞද්ගලික අංශයේ නියෝජිතයන් එහිදී අපනයන හා සම්බන්ධ මෙහෙයුම් මෙන්ම ප්‍රතිපත්තිමය ගැටළු සඳහා ද විසඳුම් ලබා දෙනු ලැබීය.

***<u>ශ්‍රී ලංකාවේ ටයර් කර්මාන්තය සඳහා නිෂ්පාදන නවෝත්පාදන, තාක්ෂණ හා පර්යේෂණ හා සංවර්ධන පිළිබඳ වැඩමුළුව.</u>***

ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන නිෂ්පාදකයින්ගේ හා අපනයනකරුවන්ගේ සංගමය (SLAMERP) හා ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනයේ සහයෝගිතාවය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලය මගින් 2018 ජුලි මස 13 වන දින සිට 14 දින දක්වා දින දෙකක (02) වැඩමුළුවක් සංවිධානය කරනු ලැබීය. පළමු සහයෝගිතා ටයර් වැඩමුළුව වන මෙය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ටයර් නිෂ්පාදනය හා අපනයනය කරන සමාගම්වල තාක්ෂණික අංශයේ 100කට වැඩි පුද්ගලයින්ගේ සහභාගිත්වයෙන් සාර්ථක ලෙස පවත්වනු ලැබීය. නිෂ්පාදන නවෝත්පාදනය, තාක්ෂණ හා පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍ර පිළිබඳව වන මෙම වැඩමුළුවේ දී ජාත්‍යන්තර තාක්ෂණික විශේෂඥයින්ගේ සේවය ලබාගැනීම මගින් ටයර් නිෂ්පාදකයින්ගේ/අපනයනකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම අරමුණු කෙරිණ.




ටයර් කර්මාන්තයේ පුද්ගලයින්ගේ තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම හා ජාත්‍යන්තර ටයර් කර්මාන්තයේ නවතම නිෂ්පාදන වැඩිදියුණු කිරීම් හා පර්යේෂණ හා සංවර්ධන සම්බන්ධයෙන් දැනුම ලබාදීම මෙම වැඩමුළුවේ අරමුණ විය.

මෙහිදි සහභාගිවූවන්ට රබර් සකස් කිරීමේ හා මිශ්‍ර කිරීමේ තාක්ෂණය, සංකීර්ණ නිර්මාණ හා වැඩි දියුණු කිරීම්, ටයර් හා ටයර් නොවන යෙදවුම් සැදීමේ ද්‍රව්‍ය ලෙස විවිධ බහු අවයවික යොදා ගැනීම, සාන්ද්‍රවීම් හා හැඩය වෙනස් වීම වැලැක්වීම, සිද්ධි අධ්‍යයනය හා මනා නිෂ්පාදන පිළිවෙත් හා වඩාත් පුළුල් ලෙස FEAS වැනි නවීන උපාංග භාවිතා කිරීමට කර්මාන්ත සඳහා අවශ්‍ය මූලික දිරිමත්කිරීම් පිළිබඳ දැනුමක් ලබා ගැනීමට හැකි විය.

***<u>කැපී පෙනෙන අත්කම් නිර්මාණකරුවන් සඳහා "ශිල්ප සවිය" ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන.</u>***

තෝරාගත් අත්කම් නිර්මාණකරුවන් 27 දෙනෙකුගේ හැකියාවන් වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව, ජාතික ශිල්ප සභාවේ (NCC) සහයෝගිතාවයෙන් මණ්ඩලය මගින් "ශිල්ප සවිය" ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. අත්කම් නිර්මාණකරුවන් ඇගයීම, නිර්මාණ යෙදවුම්, නිර්මාණ ඇගයීම මෙන්ම අවසානයේ ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය මැදිහත් විය. නිර්මාණය කරන ලද නිෂ්පාදන සඳහා අත්හදා බැලීමේ අලෙවිකරණ වැඩසටහනක් 2018 දෙසැම්බර් මාසයේදී පවත්වනු ලැබූ අතර, අවසාන ප්‍රදර්ශනය ගාල්ලේ සංස්කෘතික උත්සවයට සමගාමීව 2019 ජනවාරි මාසයේදී ගාල්ලේදී පවත්වන ලදි.

***<u>ජාතික කාබනික පාලන ඒකකය (NOCU)</u>***

වගාවන්, පිරිසැකසුම් කිරීම්, සහතිකකරණය, ලේබල් කිරීම හා අලෙවිකරණය වැනි සියළු කාබනික ආශ්‍රිත ක්‍රියාකාරකම් නිසි පරිදි අධීක්ෂණය/පාලනය කිරීම මගින් ශ්‍රී ලාංකීය කාබනික නිෂ්පාදනවල විශ්වාසනීයත්වය හා ප්‍රතිරූපය ආරක්ෂා කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජාතික කාබනික පාලන ඒකකය ස්ථාපනය කර තිබේ.

ඒකකයේ කාර්යභාරය හා කාබනික කෘෂි කාර්මික නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපළ දැක්ම පිළිබඳව දැනුම ලබාදීම සඳහා කාබනික කෘෂිකර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලි පාර්ශවකරුවන් **470**කට වැඩි පිරිසක් සඳහා මහනුවර, කුරුණෑගල, මාතර හා කොළඹ දී වැඩමුළු හතරක් **(04)** පවත්වනු ලැබීය.

කාබනික අංශයට අදාල ප්‍රමිති හා සහතිකකරණය සම්බන්ධ ප්‍රතිපත්තිමය ගැටළු හා තාක්ෂණික කරුණු පිළිබඳ තීරණ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට ඒකකය මගින් කමිටු දෙකක් **(02)** ස්ථාපනය කර ඇත. මෙම කමිටු මගින් කාබනික ආශ්‍රිත නිෂ්පාදනවල නිරත පුද්ගලයින්/ආයතන මනා අධීක්ෂණය/පහසුකම් සැලසීම සඳහා ඒවා සියල්ලම ඒකකයෙහි ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති අතර, කාබනික ආශ්‍රිත කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වෙනම **HS** කේතාංක ලබා ගැනීමේ කටයුතු අරඹා ඇත.

*<u>පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්.</u>*

ආනයන හා අපනයන ක්‍රමවේදයන් පිළිබඳව සහතිකපත්‍ර පාඨමාලා හතරක්, අයදුම්කරුවන් **162**ක් සඳහා පවත්වන ලද අතර ජාත්‍යන්තර වෙළඳාමෙහි මෙහෙයුම් අංගයන් පිළිබඳ පාඨමාලා දෙකක් සඳහා පුද්ගලයින් **97** දෙනෙකු සහභාගි විය.

*<u>වෙළඳපල වාර්තා හා වෙළඳපල පිළිබඳ පර්යේෂණ.</u>*

ආර්ථික උපායමාර්ග පිළිබඳ අන්තර් රාජ්‍ය කාර්ය සාධන බලකායේ **(ITFPED)** සහයෝගිතාවය ඇතිව චෙක් ජනරජය, එක්සත් රාජධානිය හා පකිස්ථානය ආදි විශේෂිත වෙළඳපලවල් සඳහා නිෂ්පාදන වාර්තා තුනක් සකස් කරනු ලැබීය.

ශ්‍රී ලංකාව සඳහා ප්‍රමුඛ වෙළඳපල හඳුනා ගැනීමට හා තෝරා ගත් වෙළඳපල සඳහා ඵලදායි වන නිෂ්පාදන හඳුනා ගැනීම සඳහා වෙළඳපල වාර්තා පහළොවක් යාවත්කාලීන කරනු ලැබීය. තායිලන්තය, ඉන්දියාව, පකිස්ථානය, මැලේසියාව, ඉන්දුනීසියාව, බංගලාදේශය, වියට්නාමය, තායිවානය, පිලිපීනය හා ඕස්ට්‍රේලියාව යන වෙළඳපල **10** සඳහා පර්යේෂණ සම්පූර්ණ කර වාණිජ මණ්ඩල, සංවිධාන හා කලාප සඳහා ප්‍රචාරය කරනු ලැබීය.

මත්ස්‍ය නිෂ්පාදන - සීබාස් වගාව හා මුහුදු පැළෑටි වගාව, පොල් ආශ්‍රිත අගය එකතු කරන ලද නිෂ්පාදන (පොල් ආශ්‍රිත රස කැවිලි, කේන්ද්‍රපසරණය කරන ලද පිරිසිදු පොල් තෙල් **(VCO)**, පොල් කිරි, විවර්ණ කරන ලද පොල් තෙල්, පොල් වතුර හා විභාජනය කරන ලද පොල් තෙල්) හා සහල් ආශ්‍රිත අගය එකතු කරන ලද නිෂ්පාදන (සහල් පැස්ටා) වැනි විශේෂ නිෂ්පාදන සඳහා ආදර්ශ ව්‍යාපෘති වාර්තා නවයක් **(09)** සම්පාදනය කර ප්‍රකාශයට පත් කරනු ලැබීය. අපනයනය හා ශ්‍රී ලංකාවේ අන්තර්ජාල වෙළඳාම සඳහා ඉදිකිරීම් අංශයේ ශාක්‍යතා වාර්තා දෙකක් ද සම්පාදනය කර ප්‍රකාශයට පත් කරනු ලැබීය.

**2018** දී **Business Lanka** සඟරාවේ මුද්‍රණ තුනක් පලකරනු ලැබීය. මෙම මුද්‍රණයන්හි පිළිවෙලින් අපනයනයේ නැගී එන ප්‍රවණතා, ස්වස්ථතා සංචාරක කර්මාන්තය, ජාතික අපනයන උපායමාර්ග පිළිබඳව අවධානය යොමු කරනු ලැබීය.

දේශීය වෙළඳ ප්‍රජාව සඳහා ජාතික/ජාත්‍යන්තර වෙළඳ තොරතුරු ලබාදීම මගින් පහසුකම් සැලසෙන **EXPO – NEWS** මාසික නිවේදනයේ මුද්‍රණ **12**ක් පලකරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ අපනයන අංශයට අදාල විස්තීරණ දත්ත ඇතුලත් ප්‍රකාශනයක් වන **2017** අපනයන ප්‍රගති දර්ශකය මුද්‍රිත හා සංයුක්ත තැටි මාධ්‍යයන්ගෙන් ප්‍රකාශයට පත්කොට අදාල ආයතන, වෙළඳ මණ්ඩල, විශ්වවිද්‍යාල හා වෙනත් පාර්ශවකාර ආයතන අතර බෙදා හරිනු ලැබීය.

## 11. ජනාධිපති අපනයන සම්මාන ප්‍රදාන

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 22 වන ජනාධිපති අපනයන සම්මාන ප්‍රදාන උත්සවය 2018 සැප්තැම්බර් මස 18 වන දින කොළඹ බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්විණ. මේ සඳහා කැබිනට් අමාත්‍යවරු හා නියෝජ්‍ය අමාත්‍යවරු කීපදෙනෙක්ද සහභාගි විය. ජනාධිපති අපනයන සම්මාන, ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රයත්නයේදී අපනයනකරුවන් වෙත ඔවුන් විසින් දක්වන ලද දායකත්වය ඇගයීම සඳහා ලබා දෙන ඉහලම සම්මානය වේ.

අපනයනකරුවන් 2017 දී දක්වන ලද විශේෂිත කාර්ය සාධනය වෙනුවෙන් මෙම උළෙලේදී සමස්ථ (විශේෂ) සම්මාන 11, ආංශික සම්මාන 47 කින් (ඉහල විදේශ විනිමය උපයන්නන් සඳහා සම්මාන 38ක් හා නැගී එන අපනයනකරුවන් සඳහා සම්මාන 9) සමන්විතව පිරිනමනු ලැබූ මුළු සම්මාන ගණන 59ක් විය. සම්මානලාභීන් සඳහා ගෞරවාන්විත කුසලානයක් හා සහතික පත්‍රයක් ලබාදෙනු ලැබූ අතර ඔවුන්ට වසර තුනක(3) කාලයක් සඳහා අලෙවිකරණ මෙවලමක් ලෙස සම්මාන ලකුණ ("Award Logo") භාවිතා කිරීමේ වරප්‍රසාදයද හිමිවිය.





**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**2018.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | එස්. එල්. එෆ්.ආර්.එස් 31.12.2018 | එස්. එල්. එෆ්.ආර්.එස් 31.12.2017 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. ශත. | රු. ශත. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ශුද්ධ දේපල පිරියත හා උපකරණ | (9) | 52,536,442.45 | 61,652,670.48 |
| සඳහන් නොකෙරුණු සමාගම් ආයෝජන | (10) | 997,488,451.76 | 1,088,674,019.00 |
| | | 1,050,024,894.21 | 1,150,326,689.48 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | (11) | 25,033,150.00 | 38,828,250.00 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 1,075,058,044.21 | 1,189,154,939.48 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | (12) | 2,880,646.22 | 2,123,332.25 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | (13) | 166,358,845.80 | 169,914,195.88 |
| අත්තිකාරම් හා ඉදිරි ගෙවීම් | (14) | 40,375,493.91 | 19,025,319.66 |
| මුදල් හා මුදල් සමාන දෑ | (15) | 27,562,559.10 | 3,052,305.92 |
| | | 237,177,545.03 | 194,115,153.71 |
| **මුළු වත්කම්** | | **1,312,235,589.24** | **1,383,270,093.19** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන සහ වෙන් කිරීම්** | | | |
| ආධාර ලැබීම - ප්‍රාග්ධන දායකත්වය | (16) | 10,014,284.00 | 10,014,284.00 |
| වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | 1,010,789,603.57 | 1,093,329,063.03 |
| **මුළු හිමිකම්** | | 1,020,803,887.57 | 1,103,343,347.03 |
| **ආධාර** | | | |
| ආධාර ලැබීම් - වෙනත් | (17) | 31,695,603.21 | 33,046,261.17 |
| | | 31,695,603.21 | 33,046,261.17 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| වෙන්කිරීම් හා අනිකුත් වගකීම් | (18) | 52,387,870.60 | 19,428,056,57 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | (19) | 78,998,235.75 | 89,981,884.30 |
| | | 131,386,106.35 | 109,409,940.87 |
| **ජංගම වගකීම** | | | |
| අනිකුත් ගෙවිය යුතු දෑ | (20) | 128,349,992.11 | 99,243,923.67 |
| බැංකු අයිරාව | (21) | - | 38,226,620.45 |
| | | 128,349,992.11 | 137,470,544.12 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,312,235,589.24** | **1,383,270,093.19** |

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධක්‍ෂ මණ්ඩලය වගකීම දරණු ලබයි. අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් 2018.12. 31 දිනට අත්සන් කලේ,

| | | | |
|---|---|---|---|
| ................................ | ................................ | ........................ | ................................ |
| ඉන්දිරා මල්වත්ත | වයි. කේ. මරික්කාර් | පී.එච්.ඒ.එස්. විජේරත්න | ජී. එම්. හේරත් |
| සභාපතිනිය සහ ප්‍රධාන විධායක | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | මුදල් අධ්‍යක්ෂිකා |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් හා වියදම් ප්‍රකාශය**

| | සටහන | එස්. එල්. එෆ්. ආර්.එස් **31.12.2018** රු. ශත. | එස්. එල්. එෆ්. ආර්. එස් **31.12.2017** රු. ශත. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආදායම | (3) | 598,941,650.93 | 430,305,985.15 |
| අනෙකුත් ආදායම් | (4) | 53,958,505.63 | 150,526,909.55 |
| මුළු ආදායම | | 652,900,156.56 | 580,832,894.70 |
| **වියදම්** | | | |
| අපනයන සංවර්ධන වියදම | (5) | (255,842,018.46) | (227,356,965.19) |
| පරිපාලන වියදම | (6) | (404,302,610.60) | (371,931,635.89) |
| ආශ්‍රිත සමාගමේ ආයෝජනයෙන් ලද අලාභය | | (91,185,567.24) | – |
| මෙහෙයුම් වියදම් ඉක්මවූ ආදායම | | (98,430,039.74) | (18,455,706.38) |
| මූල්‍ය වියදම් | (7) | (985,362.28) | (1,826,767.26 |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වියදම ඉක්මවූ අතිරික්තය | | (99,415,402.02) | (20,282,473.64) |
| **අනිකුත් විස්තීර්ණ ආදායම්** | | | |
| දේපල හා පිරියත ප්‍රත්‍යාගණනයේ ලාභ/(අලාභ) | (8) | - | - |
| වර්ෂයේ අනිකුත් විස්තීර්ණ ආදායම | | - | - |
| **වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම** | | **(99,415,402.02)** | **(20,282,473.64)** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2018.12.31 දිනට අවසන් වර්ෂය සඳහා**
**හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය**

| | රාජ්‍ය ආධාර | සමුච්චිත ලාභ | එකතුව |
|---|---|---|---|
| **2016.12.31 දිනට ශේෂය** | 10,014,284.00 | 1,114,175,580.99 | 1,124,189,864.99 |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | - | (20,282,473.64) | (20,282,473.64) |
| පෙර වර්ෂයේ ගැලපීම | - | (564,044.32) | (564,044.32) |
| **2017.12.31 දිනට ශේෂය** | **10,014,284.00** | **1,093,329,063.03** | **1,103,343,347.03** |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | - | (99,415,402.02) | (99,415,402.02) |
| පෙර වර්ෂයේ ගැලපීම් (24) | - | 16,875,942.56 | 16,875,942.56 |
| **2018.12.31 දිනට ශේෂය** | **10,014,284.00** | **1,010,789,603.57** | **1,020,803,887.57** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**2018.12.31 දිනට අවසන් වර්ෂය සඳහා - මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| **මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද වියදමට වැඩි ආදායම | | (99,415,402) | (20,282,474) |
| ගැලපීම් | | | |
| ක්ෂයවීම් | | 13,781,736 | 12,789,848 |
| ආයෝජන වලින් ලද ආදායම | | 49,138,346 | (138,631,888) |
| පෙර වර්ෂය සඳහා ගැලපුම් | | 16,875,943 | (364,044) |
| මූල්‍ය වියදම | | 362,324 | 355,113 |
| රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය | | (6,052,691) | (5,312,349) |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 11,095,902 | 12,490,723 |
| හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන | | 13,795,100 | **1,719,900** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | **(418,742)** | (137,435,172) |
| තොගය (වැඩිවීම)/අඩුවීම | | (757,314) | (282,704) |
| ණය ගැති හා ලැබියයුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 3,555,350 | (22,560,108) |
| අත්තිකාරම් හා කලින් ගෙවම් (වැඩිවීම)/අඩුවීම | | (21,350,174) | (1,727,866) |
| වෙන්කිරීම් හා වෙනත් ගෙවියයුතු දෑ වැඩිවීම/(අඩුවීම) | | 32,959,814 | (21,465,455) |
| වෙනත් ගෙවියයුතු දෑ වැඩිවීම/ (අඩුවීම) | | 29,106,068 | 35,491,986 |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | **43,095,003** | **(127,205,356)** |
| මූල්‍ය වියදම් ගෙවීම් | | (362,324) | (355,113) |
| පාරිතෝෂික ගෙවීම් | | (22,079,551) | (10,565,856) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලායාම** | | **20,653,128** | **(68,909,619)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම් | **9** | (4,665,508) | (3,486,901) |
| ලාභාංශ ලැබීම් | **4** | 40,197,528 | 60,166,344 |
| පොලී ලැබීම් | **4** | 1,849,692 | 2,259,399 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලාඒම** | | **37,831,713** | **58,938,842** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| රාජ්‍ය ආධාර ලැබීම් | | 4,702,033 | 5,390,622 |
| **මූල්‍ය ක්‍රියායාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **4,702,033** | **5,390,622** |
| **වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම/අඩුවීම** | | **62,736,874** | **(73,796,861)** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | (35,174,315) | 38,622,546 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **27,562,559** | **(35,174,315)** |
| **මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය** | | | |
| අතැති මුදල් | **15** | 62,047 | 71,357 |
| බැංකුවේ ඇති මුදල් | **15** | 27,500,512 | 2,980,948 |
| බැංකු අයිරා | **21** | - | (38,226,620) |
| | | **27,562,559** | **(35,174,315)** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**2018.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්**

| | | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 රු. ශත. |
|---|---|---|---|---|
| **(3)** | **ආදායම්** | | | |
| | රාජ්‍ය ලැබීම් | | 529,907,492.28 | 352,643,377.60 |
| | අපනයන සේවා ආදායම් | | 57,360,883.70 | 59,963,966.00 |
| | පලාත් කාර්යාල ආදායම් | | 100,773.79 | 92,119.82 |
| | අන්තර්ජාල ආදායම් | | 379,070.00 | 577,429.00 |
| | විද්‍යුත් වෙළඳ ආදායම | | 308,019.16 | 557,729.87 |
| | WEDF ආදායම | | - | 750,000.00 |
| | සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු | | 5,752,100.00 | 5,249,544.81 |
| | පොත් අලෙවිය | | 233,362.00 | 232,946.00 |
| | වෙනත් ආදායම් | (3.1) | 4,899,950.00 | 10,238,872.05 |
| | | | **598,941,650.93** | **430,305,985,.15** |
| **(3.1)** | **වෙනත් ආදායම්** | | | |
| | පාවහන් සහ සම් නිෂ්පාදන ප්‍රදර්ශනය | | 110,000.00 | 40,000.00 |
| | නිෂ්පාදන සංවර්ධන ක්‍රියාකාරකම් | | - | 15,000.00 |
| | වෙළඳපල සංවර්ධන සහකාර යෝජනා ක්‍රමය | | 854,000.00 | 5,925,000.00 |
| | සිලෝන් කුරුඳු ලාංඡනය ලියාපදිංචි කිරීම | | 165,000.00 | 159,000.00 |
| | ආපසු නොගෙවන තැන්පතු | | 50,000.00 | 58,000.00 |
| | නීති ගාස්තු | | 11,000.00 | 213,300.00 |
| | දැන්වීම් පුවරු ආදායම – 9 වන මහල | | 700,000.00 | 1,000,000.00 |
| | ප්‍රතිපාදන සහ ගැලපීම් | | 3,009,950.00 | 2,828,572.05 |
| | | | **4,899,950.00** | **10,238,872.05** |
| **(4)** | **අනෙකුත් ආදායම්** | | | |
| | පොලී ආදායම් | | 1,849,692.46 | 2,259,399.30 |
| | ආශ්‍රිත සමාගම් ලාභ | | - | 76,206,145.00 |
| | ලාභාංශ | | 40,197,528.33 | 60,166,343.52 |
| | අනිකුත් විවිධ ආදායම් | (4.1) | 1,185,438.81 | 2,158,379.62 |
| | ක්‍රමක්ෂය රාජ්‍ය ආධාර | | 6,052,690.68 | 5,312,349.48 |
| | සේවක ණය පොලී (IFRS) | | 4,673,155.35 | 4,424,292.63 |
| | | | **53,958,505.63** | **150,526,909.55** |
| **(4.1)** | **අනිකුත් විවිධ ආදායම** | | | |
| | අපනයනකරුවන් ලියාපදිංචි කිරීම | | - | 807,500.00 |
| | එස්.එල්. එක්ස්පෝ සඳහා අනුග්‍රාහකත්වය | | 750,000.00 | - |
| | විවිධ ලැබීම් | | 231,134.23 | 1,122,884.65 |
| | ආදායම – ලියාපදිංචිය / සේවා | | 158,075.75 | 80,146.25 |
| | විනිමය අනුපාතවල වෙනස | | 46,228.83 | 147,848.72 |
| | | | **1,185,438.81** | **2,158,379.62** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**2018.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්**

| | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 රු. ශත. |
|---|---|---|---|
| **(5)** | **අපනයන සංවර්ධන වියදම්** | | |
| | නිෂ්පාදන/ වෙළඳපල සංවර්ධන වැඩසටහන් | 94,468,461.97 | 76,408,185.53 |
| | අපනයන වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් - විදේශ | 123,580,333.09 | 124,959,153.76 |
| | අපනයන වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් - දේශීය | 13,372,985.11 | 9,331,035.42 |
| | WEDF | 712,093.37 | 1,552,325.10 |
| | අපනයන වෙළඳ ප්‍රදර්ශන - දේශීය | 2,275,329.60 | 2,456,888.96 |
| | ප්‍රතිපත්ති හා සැලසුම් වියදම් | 8,101,669.79 | 2,221,120.84 |
| | ප්‍රාදේශීය සංවර්ධන වියදම් | 5,928,661.89 | 7,005,857.70 |
| | වෙළඳ තොරතුරු හා සේවා වියදම් | 7,194,915.37 | 3,403,181.88 |
| | වෙළඳ ප්‍රවර්ධන වේදිකාව | - | 1,375.00 |
| | ශ්‍රී ලංකා කුරුඳු සන්නම් නිරමාණය | 207,568.27 | 17,841.00 |
| | | **255,842,018.46** | **227,356,965.19** |
| **(6)** | **පරිපාලන වියදම්** | | |
| | වැටුප් හා වේතන | 142,808,241.17 | 138,409,028.75 |
| | අතිකාල හා නිවාඩු දීමනා | 9,318,771.02 | 6,552,924.53 |
| | ප්‍රසාද දීමනා | 3,093,155.50 | 2,560,467.00 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 19,368,961.45 | 17,884,441.25 |
| | සේවක භාරකාර අරමුදල | 3,909,643.88 | 5,622,626.35 |
| | පාරිතෝෂික දීමනා | 11,095,902.25 | 12,490,722.80 |
| | සුභසාධන | 13,535,976.41 | 10,757,304.82 |
| | වෛද්‍ය නිවාඩු සඳහා මුදල්ගෙවීම් | 11,089,554.79 | 10,254,176.59 |
| | බඳවාගැනීම් වියදම් | 1,866,125.48 | 1,963,607.63 |
| | සේවක පිරිවැය (IFRS ගැලපීම) | 4,673,155.35 | 4,424,292.63 |
| | විදුලි ගාස්තු | 16,952,769.10 | 20,154,823.66 |
| | ජල ගාස්තු | 919,457.28 | 804,555.82 |
| | නීති හා වෙනත් වෘත්තීය ගාස්තු | 323,179.76 | 80,627.50 |
| | ප්‍රචාරණය | 414,996.20 | 917,037.59 |
| | ආරක්ෂක වියදම් | 4,466,242.85 | 7,255,348.17 |
| | විගණන ගාස්තු | 1,614,600.00 | 700,000.00 |
| | මුද්‍රණ වියදම් | 636,757.34 | 604,845.50 |
| | ගමන් වියදම් | 18,024,092.60 | 13,809,986.34 |
| | විනෝදාශ්වාද | 145,216.70 | 182,968.12 |
| | පොදු වියදම් | 1,488,302.51 | 1,532,242.92 |
| | අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | 1,270,819.00 | 1,164,579.06 |
| | කාර්යාල උපකරණ නඩත්තුව | 1,462,874.04 | 3,453,626.24 |
| | ගොඩනැගිලි කුලී | 72,520,044.13 | 63,545,733.86 |
| | ඉන්ධන හා තෙල් | 3,529,143.19 | 5,190,773.70 |
| | වාහන නඩත්තු අලුත්වැඩියා | 4,210,573.78 | 4,423,394.54 |
| | පුද්ගලික කුලී | 7,513,720.90 | 7,443,849.90 |
| | සන්නිවේදන හා සාමාජික මුදල් | 8,692,230.33 | 9,161,319.09 |
| | ක්ෂය | 13,782,260.75 | 13,292,731.86 |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2018.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්**

| | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 රු. ශත. |
|---|---|---|
| **පරිපාලන වියදම්** | | |
| දේශීය පුහුණු වියදම් | 1,382,327.19 | 928,587.10 |
| කාර්යාල අවශ්‍යතා | 4,756,280.85 | 4,217,798.02 |
| විදේශීය පුහුණු වියදම් | 3,119,443.25 | 2,147,214.55 |
| ආයෝජන වටිනාකම හානිකරණ සඳහා ප්‍රතිපාදන | 16,258,550.00 | - |
| ISO ක්‍රියාත්මක කිරීමේ වියදම් | 59,241.55 | - |
| | **404,302,610.60** | **371,931,635.89** |
| **(7) මූල්‍ය පිරිවැය** | | |
| පොලී වියදම් | 362,324.15 | 355,113.32 |
| මුද්දර ගාස්තු | 100,284.76 | 728,028.76 |
| මූල්‍ය වියදම් | 522,753.37 | 743,625.18 |
| | **985,362.28** | **1,826,767.26** |

**(8) මෝටර් රථ ප්‍රත්‍යාගණය**

මණ්ඩලයට අයිති මෝටර් රථ ශ්‍රී ලංකා ඔටෝමොබයිල් සමාගම විසින් 2012.12.31 දිනට නැවත අගය කරන ලදි. වසර පහකට වරක් මෝටර් රථ වාහන නැවත අගය කිරීමට බලාපොරොත්තු වේ.

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
## 2018.12.31 දිනට මුල්‍ය ප්‍රකාශනවල සටහන්

### (9) දේපල යන්ත්‍ර හා උපකරණ
### (9.1) පිරිවැය

| ශේෂය 01/01/2017 | වත්කම් | ශේෂය 01/01/2018 | එකතුකිරීම් | නැවත තක්සේරු කිරීම | ඉවත් කිරීම් | ශේෂය 31/12/2018 |
|---|---|---|---|---|---|---|
| 99,364.00 | ගෘහස්ත දුරකථන | 116,442.00 | - | - | - | 116,442.00 |
| 75,343,100.00 | මෝටර් රථ | 75,376,45000 | - | - | - | 75,376,450.00 |
| 36,802,808.52 | පරිගණක | 38,755,708.52 | 3,083,800.00 | - | - | 41,839,508.52 |
| 6,066,080.50 | පරිගණක මෘදුකාංග | 5,751,681.00 | 800.00 | - | 18,000.00 | 5,734,481.00 |
| 1,053,894.45 | පරිගණක උපකරණ | 1,362,942.85 | 397,967.72 | - | - | 1,760,910.57 |
| 735,930.00 | කියොස්ක් පද්ධතිය | 735,930 | - | - | - | 735,930.00 |
| 4,816,845.01 | රූපවාහිනී උපකරණ | 4,816,845.01 | - | - | - | 4,816,845.01 |
| 65,549.00 | පී.ඒ.බී.එක්ස් උපකරණ | 65,549.00 | - | - | - | 65,549.00 |
| 1,540,830.14 | දුරකථන සවිකිරීම් | 1,632,002.14 | 88,100.00 | - | - | 1,720,102.14 |
| 15,595,618.57 | ලී බඩු සවිකිරීම | 15,844,307.07 | 482,300.00 | - | - | 16,326,607.07 |
| 15,734,150.59 | කාර්යාල උපකරණ | 16,867,974.09 | 648,540.00 | - | 18,000.00 | 17,498,514.09 |
| - | වෙනත් උපකරණ | 15,240.00 | - | - | - | 15,240.00 |
| **157,854,170.78** | | **161,341,071.68** | **4,701,507.72** | - | **36,000.00** | **166,006,579.40** |

(9.2) ක්ෂය වෙන්කිරීම්

| ශේෂය 01/01/2017 | වත්කම | ශේෂය 01/01/2018 | වර්ෂය සඳහා ක්ෂය | ඉවත් කිරීම් සඳහා ක්ෂය වෙන් කිරීම් | ශේෂය 31/12/2018 |
|---|---|---|---|---|---|
| 82,610.70 | ගෘහස්ත දුරකථන | 68,757.15 | 7,121.64 | - | 75,878.79 |
| 27,287,269.99 | මෝටර් රථ | 35,543,353.32 | 8,257,645.00 | - | 43,800,998.32 |
| 30,345,411.54 | පරිගණක | 32,541,802.82 | 2,174,879.45 | - | 34,716,682.27 |
| 3,682,713.82 | පරිගණක මෘදුකාංග | 3,805,430.49 | 879,815.50 | 375.00 | 4,684,870.99 |
| 732,927.67 | පරිගණක උපකරණ | 884,623.84 | 230,249.97 | - | 1,114,873.81 |
| 12,265.50 | කියොස්ක් පද්ධතිය | 159,451.50 | 147,186.00 | - | 306,637.50 |
| 3,753,808.78 | රූපවාහිනී උපකරණ | 3,984,519.89 | 230,711.11 | - | 4,215,231.00 |
| 40,752.01 | පී.ඒ.බී.එක්ස් උපකරණ | 47,306.91 | 6,554.90 | - | 53,861.81 |
| 1,505,217.02 | දුරකථන සවිකිරීම | 1,543,935.43 | 36,396.98 | - | 1,580,332.41 |
| 7,275,394.00 | ලී බඩු සවිකිරීම | 8,050,759.73 | 824,285.06 | - | 8,875,044.79 |
| 12,180,182.58 | කාර්යාල උපකරණ | 13,058,155.12 | 982,335.65 | 150.00 | 14,040,340.77 |
| - | වෙනත් උපකරණ | 305.00 | 5,079.49 | - | 5,384.49 |
| **86,898,553.61** | | **99,688,401.20** | **13,782,260.75** | **501,050.24** | **113,470,136.95** |

| | ලියා හරින ලද වටිනාකම | 2017 | 2016 |
|---|---|---|---|
| 157,854,170.78 | පිරිවැය | 166,006,579.40 | 161,341,071.68 |
| (86,898,553.61) | සමුච්චිත ක්ෂය කිරීම් | (113,470,136.95) | (99,688,401.20) |
| **70,955,617.17** | ලියා හරින ලද වටිනාකම | **52,536,442.45** | **61,652,670.48** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2018.12.31 අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්**

| | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 රු ශත. |
|---|---|---|---|
| **(10)** | **ආශ්‍රිත සමාගම් ආයෝජන - ලැයිස්තුගත නොවන** | | |
| | ආශ්‍රිත සමාගම් ආයෝජන - ඩී.එච්.පී.එල්. | 997,488,451.76 | 1,088,674.019.00 |
| | | **997,488,451.76** | **1,088,674.019.00** |
| **(11)** | **වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්** | | |
| | නිදහස් කළ හැකි වරණීය කොටස් | 105,066,208.78 | 105,058,083.78 |
| | සාමාන්‍ය කොටස් | 58,312,483.61 | 58,312,483.62 |
| | (-) හානිකරණ සඳහා වෙන් කිරීම් | (138,345,542.39) | (124,550,442.39) |
| | | **25,033,150.00** | **38,828,250.00** |
| **(12)** | **තොගය** | | |
| | ලිපිද්‍රව්‍ය | 2,502,172.55 | 2,123,332.25 |
| | ටයර් සහ ටියුබ් | 378,473.67 | - |
| | | **2,880,646.22** | **2,123,332.25** |
| **(13)** | **වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | |
| | අපනයනකරුවන්ගේ ණය | 40,801,501.60 | 41,348,001.60 |
| | (-) ණයගැති හානිකරණ වෙන් කිරීම් | (40,801,501.60) | (41,348,001.60) |
| | කාර්ය මණ්ඩල ණය | 42,460,357.59 | 40,453,916.07 |
| | (-) ගෙවිය යුතු සේවක පිරිවැය | (4,116,730.92) | (556,424.43) |
| | ලැබිය යුතු වැට් | 104,676,878.80 | 104,676,878.80 |
| | UPEPV - පාලන ගිණුම | 10,403,683.00 | 10,403,683.00 |
| | වෙනත් ණයගැති | 12,934,657.33 | 14,936,142.44 |
| | | **166,358,845.80** | **169,914,195.88** |
| **(14)** | **අත්තිකාරම් හා පෙරගෙවුම්** | | |
| | පෙරගෙවුම් | 24,449,872.17 | 2,463,069.30 |
| | අත්තිකාරම් | 8,845,240.66 | 13,125,175.77 |
| | බැංකු සුරක්ෂිත | 300,000.00 | 300,000.00 |
| | සේවා තැන්පතු | 1,572,260.00 | 1,497,260.00 |
| | ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතු | 969,390.16 | 969,390.16 |
| | අවලංගු චෙක්පත් | 122,000.00 | 114,000.00 |
| | කලින් ගෙවූ කාර්ය මණ්ඩල වියදම් | 4,116,730.92 | 556,424.43 |
| | | **40,375,493.91** | **19,025,319.66** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2018.12.31 අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්**

| | | එස්,එල්.එෆ් ආර්.එස් 31.12.2018 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 රු. ශත. |
|---|---|---|---|
| **(15)** | **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| | ලංකා බැංකුව - මුදල් අයකැමි තැන්පත් | 2,500.00 | 2,500.00 |
| | ලංකා බැංකුව - ලේක් වීව් (306605) | 24,400,925.19 | - |
| | ජාතික සංවර්ධන බැංකුව | 2,746,062.27 | 2,535,581.62 |
| | ලංකා බැංකුව - කෝපරේට් ශාඛාව | 135,091.82 | 212,229.35 |
| | ඩී. එෆ්. සී. සී. - කෝපරේට් ශාඛාව | 148,890.00 | 198,890.00 |
| | සම්පත් බැංකුව - මහනුවර | 5,551.03 | 5,181,.92 |
| | සම්පත් බැංකුව - ගාල්ල | 7,494.08 | 7,332.63 |
| | ලංකා බැංකුව - මන්නාරම | 26,639.01 | 2,125.26 |
| | සම්පත් බැංකුව- කුරුණෑගල | 17,358.71 | 17,107.67 |
| | අතැති මුදල් | 62,046.99 | 71,357.47 |
| | | **27,562,559.10** | **3,052,305.92** |
| **(16)** | **රජයේ ලැබීම් - ප්‍රාග්ධන දායකය** | | |
| | රජයේ දායකය | 7,904,002.00 | 7,904,002.00 |
| | යූ.එන්.ඩී.පී. දායකය | 2,110,282.00 | 2,110,282.00 |
| | | **10,014,284.00** | **10,014,284.00** |
| **(17)** | **රජයේ ලැබීම්** | | |
| | රජයේ දායකය - මෝටර් රථ | 38,826,450.00 | 38,826,450.00 |
| | රජයේ දායකය - වෙනත් | 14,436,642.63 | 10,674,134.92 |
| | අයි.ටී.සී දායකය | 12,716.35 | 12,716.35 |
| | අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | 202,677.32 | 202,677.32 |
| | එම්.ඕ.ඩී.එස්.අයි.ටී දායකය | 939,000.00 | - |
| | (-) රජයේ ආධාර ක්‍රමක්ෂය | (22,721,883.09) | (16,669,717.42) |
| | | **31,695,603.21** | **33,046,261.17** |
| **(18)** | **වෙනත් වගකීම් හා වෙන්කිරීම්** | | |
| | ණය ආධාර ක්‍රම දායකත්වය | 7,820,688.23 | 7,796,197.30 |
| | ඌව පරණගම ආශ්‍රිත ගම්මාන | 2,108,251.77 | 2,108,251.77 |
| | අපනයනකරු දායකත්වය | 34,480,276.00 | 1,852,791.00 |
| | ආපසු ගෙවිය යුතු තැන්පතු | 7,978,654.60 | 7,670,816.50 |
| | | **52,387,870.60** | **19,428,056.57** |
| **(19)** | **පාරිතෝෂික සඳහා වෙන් කිරීම්** | | |
| | ඉදිරියට ගෙන ආ ශේෂය | 89,981,884.30 | 88,057,017.00 |
| | වර්ෂය තුල කළ වෙන් කිරීම් | 11,095,902.25 | 12,490,722.80 |
| | වර්ෂය තුල කළ ගෙවීම් | (22,079,550.80) | (10,565,855.50) |
| | ඉදිරියට ගෙන ආ ශේෂය | **78,998,235.75** | **89,981,884.30** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2018.12.31 අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්**

| | | එස්,එල්.එෆ් ආර්.එස් 31.12.2018 රු ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 රු ශත. |
|---|---|---|---|
| **(20)** | **වෙනත් ගෙවියයුතු දෑ** | | |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 20,125.00 | 24,575.00 |
| | ගෙවිය යුතු උ.වි.ගෙ බදු | 95,829.00 | - |
| | ගෙවිය යුතු විවිධ වියදම් | 165,739.98 | 165,835.70 |
| | ගෙවිය යුතු සේ. අ. අ. වියදම් | 2,567,672.87 | 36,323,276.18 |
| | ගෙවිය යුතු සේ. භා. අ. වියදම් | 308,120.77 | 306,222.56 |
| | සේවක අවසාන ගෙවීම් | 85,807.19 | 22,605.36 |
| | ගෙවිය යුතු රඳවාගැනීමේ බදු | 4,513,260.00 | - |
| | ගෙවිය යුතු වැටුප | 93,845.80 | 242,843.13 |
| | ගෙවිය යුතු විගණන ගාස්තු | 1,994,672.00 | 1,994,672.00 |
| | නැවත ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු | 2,500.00 | 2,500.00 |
| | නැවත ගෙවිය යුතු තැන්පතු- ටෙන්ඩර් | 243,000.00 | 243,000.00 |
| | ඉදිරිපත් නොකල චෙක්පත් | 586,047.34 | 388,340.16 |
| | වෙනත් උපචිත වියදම් | 104,336,647.41 | 59,530,053.58 |
| | පාලන ගිණුම – එන්.ටී.එස් | 1,372,984.67 | - |
| | පාලන ගිණුම – බී.එස්.යු | 5,771,436.28 | - |
| | පාලන ගිණුම –යටිතල පහසුකම්/ බෝට්ටු තැනීම් | 6,192,303.80 | - |
| | | **128,349,992.11** | **99,243,923.67** |
| **(21)** | **බැංකු අයිරාව** | | |
| | ලංකා බැංකුව - ලේක් වීව් | - | 38,226,620.45 |
| | | **-** | **38,226,620.45** |

**(22)** ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත 39 ට අනුව හිමිකම් කොටස් ආයෝජනය හානිකරණ පරීක්ෂා කරන ලදි. ඒ අනුව 01.01.2011 දිනට හානිකරණ වෙන් කිරීම නැවත ගැලපීම රු 31,698,150කි.

**(23)** **(23.1) කාර්ය මණ්ඩල ණය**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 39 ට අනුව 01.01.2013 දිනට පැවති කාර්ය මණ්ඩල ණය පවත්නා පොලී අනුපාතයට අනුව හානිකරණ පාඩු අඩුකොට අවකරණය කරන ලදී . ඒ අනුව ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය සහ එස්.එල්.එෆ් ආ'ර්.එස් ගැලපීම් අගය රු: 16,060,711.67 ගිණුම්කරණ පොත්වල ගලපන ලදි.

**(23.2)** එස්.එල්.එෆ් ආ'ර්.එස්.ගැලපීම් ගිණුමේ ශේෂය කාර්ය මණ්ඩල ණය ගිණුමෙන් අඩුකරන ලදි. එ අනුව කාර්ය මණ්ඩල ණය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සාධාරණ අගයට පෙන්වා ඇත.

| | |
|---|---|
| කාර්ය මණ්ඩල ණය | 556,424.43 |
| එස්,එල්.එෆ් ආර්.එස් ගැලපීම් | (4,673,155.35) |
| | (4,116,730.92) |

**(23.3)** ඉහත ගැලපීමෙන් හටගත් ඉදිරියට කළ කාර්ය මණ්'ඩල පිරිවැය ජංගම වත්කම් යටතේ පෙන්වා ඇත.

| | |
|---|---|
| ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය | 4,673,155.35 |

## (24) පෙර වර්ෂයේ ගැලපීම්

පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනාගැනීම් සහ මිනුම් සම්බන්ධව සිදු වී ඇති වැරදි නිවැරදි කිරීම් වලට අදාළ ගැලපීම් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදුකර ඇත. දෝෂ සිදුවී ඇති කාල සීමාවන් සඳහා මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීම ප්‍රායෝගික නොවන බැවින්, වත්මන් වසරේ මූල්‍ය ප්‍රකාශන ඒ අනුව සකස් කර ඇත.

| පෙර වර්ෂයේ වැරදිවල ස්වභාවය | මූල්‍ය ප්‍රකාශනවලට බලපාන අයිතමය | වටිනාකම (රු.) |
|---|---|---|
| ලෙජර ගනුදෙනු දෝෂ නිවැරදි කිරීම | අදාළ වියදම් ගිණුම | (5,008,685.19) |
| 2017 ට අදාළ 2018 දී ගෙවන ලද වියදම් | අදාළ වියදම් ගිණුම | 184,821.43 |
| අධි ප්‍රතිපාදන ආපසු හැරවීම | අදාළ වියදම් ගිණුම | (8,280,711.69) |
| 2017 දී කරන ලද පාරිතෝෂික ප්‍රතිපාදන නිවැරදි කිරීම | පාරිතෝෂික වියදම් ගිණුම | (8,422,211.80) |
| පූර්ව වර්ෂවලට අදාළ ප්‍රතිපාදන සැපයීම | අදාළ වියදම් ගිණුම | 5,131,222.54 |
| චෙක්පත් කල් ඉකුත්වීම හේතුවෙන් අවලංගු කිරීම් | අදාල ලෙජර ගිණුම් | (480,377.56) |
| | | **(16,875,942.56)** |

## (25) සම්බන්ධිත පාර්ශවයන් සමග ගනුදෙනු

සම්බන්ධිත පාර්ශවයන් සමග ගනුදෙනු ලෙස සලකනු ලබන්නේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී තම ආශ්‍රිත සමාගම වූ ඩිවලොප්මන්ට් හෝල්ඩින් (පුද්ගලික) සමාගමට කරනු ලබන ගෙවීම්ය. 2018 වසර තුළ සම්බන්ධිත පාර්ශවයන් සමග පහත ගනුදෙනු සිදුකර ඇත.

| නම | ගනුදෙනුව | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|---|
| ඩිවලොප්මන්ට් හෝල්ඩින් (පුද්ගලික) සමාගම | මාසික කුලිය | 39,312.500.00 | 60,000,000.00 |
| | වාහන ගාල් කිරීමේ ගාස්තු | 698,214.30 | 394,285.68 |
| | විදුලිබල වියදම් | 13,982,726.65 | - |
| | ජල වියදම් | 211,032.52 | මෙම වියදම් 2017 දී අනාවරණය නොවීය |
| | වායුසමීකරණ වියදම් | 125,414.57 | |
| | සනීපාරක්ෂක වියදම් | 182,181.07 | |
| | ශ්‍රවණාගාර ගාස්තු | 353,322.77 | 405,303.74 |
| | ලාභාංශ ලැබීම් | 36,244,971.00 | 36,244,971.00 |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**2018.12.31 අවසන් වර්ෂය සඳහා**

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්

## (26) අසම්භාව්‍ය වත්කම් සහ වගකීම්

පහත සඳහන් විස්තර හැර ශේෂ පත්‍ර දිනට වෙනත් අවිනිශ්චිත වත්කම් හෝ වගකීම් නොමැත.

| | 2018.12.31 දිනට පැවති අසම්භාව්‍ය වත්කම්වල ස්වභාවය | අසම්භාව්‍ය වත්කම හටගත් පාර්ශවය | ඇස්තමේන්තුගත මුදල් ගලාඒම් | මුදල් ලැබීම් මැනීමට නොහැකි නම |
|---|---|---|---|---|
| i. | නොගෙවන ලද කුලී, විදුලිය හා පවිත්‍රතා ගාස්තු අය කරගැනීමට නඩු පැවරීම - වෙන්නායි වෙළඳ මධ්‍යස්ථානය. | පිමා හෝල්ඩින් (පුද්ගලික) සමාගම | 1,284,515.00 | නීති වියදම |
| | | පේම් නේෂන් (පුද්ගලික) සමාගම | 2,226,596.78 | නීති වියදම |
| | | යුනික් මල්ටි ආර්ටිස්ට් | 194,142.50 | - |
| | | සාරා ඕස් ලෙදර් (පුද්ගලික) සමාගම | 2,125,000.00 | - |
| ii. | ණය පැහැරහැරීම්. | ඉන්ටර්නැෂනල් පේපර් ප්‍රඩක්ට්ස් | 476,973.00 | - |
| | | වර්ක්ස් ඔෆ් ආර්ට්ස් | 42,000.00 | - |
| | | රාජාස් ජුවලරි | 90,418.00 | - |
| | | ශ්‍රීමත් සී ෆුඩ්ස් | 169,620.00 | - |
| | | සිලෝන් ඕනමන්ටල් සෙරමික්ස් | 299,720.00 | - |
| | | කොකනට් හස්ක් චිප්ස් | 44,800.00 | - |
| | | සමන් ජෙම් ඇන්ඩ් ජුවලර්ස් | 252,912.02 | - |
| | | යුනිසයිකල් මාර්කටින් | 278,455.58 | - |
| | | වර්ල්ඩ් ෆැෂන් | 30,000.00 | - |
| | | යුනික් මල්ටි ආර්ටිස්ට් | 287,006.54 | - |
| iii. | පසුගෙවුම් ගමන් වියදම් අය කර ගැනීම. | එස්. වීරකෝන් මිය | ඇ.එ.ජ. ඩොලර් 1,598.46 | - |
| iv. | බැඳුම්කරය ආපසු ගැනීම. | සිරිකුමාර | 104,725.45 | - |
| v. | අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගෙවන ලද අත්තිකාරම් ගෙවීම් ආපසු ගෙවන නඩුව. | සෝලාර් ග්‍රීන් ප්ලාන්ටේෂන්(පුද්ගලික) සමාගම. | 1,505,932.00 | - |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/එෆ්/ඊඩීබී/1/18/10

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 මැයි 31 දින.

සභාපති

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

පහත සඳහන් කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

RECEIVED 1128 04 JUN 2019 Director General's Office

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල පොදු කරුණු සටහන් අංක 2.3.3 යටතේ දක්වා ඇති පරිදි පරිගණක හා උපකරණ සියයට 25 කින් ක්ෂය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී සියයට 20ක් ක්ෂය කර තිබීම නිසා පරිගණක හා උපකරණ ක්ෂය රු.126,485ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබූ ව්‍යාපෘතියකින් මණ්ඩලයට අයවිය යුතු රු.2,323,225ක් ණයගැතියන් ලෙස ගිණුම්ගත නොකර අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලට අදාල ව සිදුකර තිබූ එකතුව රු.158,853ක් වූ නිල ලාංඡන මුද්‍රණය සහ ටෝනර් මිල දී ගැනීමට වූ වියදම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2012 වර්ෂයේ දී රු.12,900,000කට ප්‍රත්‍යාගණනය කර මේ වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ මෝටර් වාහන සමාලෝචිත වර්ෂයේ දී රු.2,010,000කින් ක්ෂය කර තිබුණි.

(ඉ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල පොදු කරුණු සටහන් අංක 2.3.3 යටතේ දක්වා ඇති වසර 10 ට වඩා වැඩි කාලයක් භාවිතා කල මෝටර් වාහන සඳහා සියයට 20 කින් ක්ෂය වෙන් කිරීම් සිදු කල යුතු වුවත් 2013 ජනවාරි 01 දිනට රු.24,200,000 කට ප්‍රත්‍යාගණනය කළ වර්ෂ 10 ක් භාවිතා කල මෝටර් රථ සඳහා ද සියයට 10 කින් ක්ෂය කර තිබීම නිසා ක්ෂය වීම් රු.2,420,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම

ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ***පහත සඳහන් නිරීක්ෂණ හැර*** යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 396 | 2018 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් සඳහා නිකුත් කරන ලද මාස 06 ඉක්ම වූ අගරු වූ රු.586,047 ක චෙක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. |
| **(ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ** | |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී12 දරන චක්‍රලේඛයේ 4.2.6. ඡේදය | කාර්තුවක් අවසන් වී දින 30ක් තුළ රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට කාර්තුමය කාර්යසාධන |

වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**3. අනෙකුත් විගණන නිරීක්ෂණ**

**(අ) ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

(i) එකතු කළ අගය මත බදු ගිණුමේ 2013 වර්ෂයේ සිට පැවැති ලැබිය යුතු ශේෂය වූ රු.104,676,878 නිරවුල් කරගෙන නොතිබුණි.

(ii) 2009 වර්ෂයේ සිට පැවැත එන ඌව පළාත් කෘෂි අපනයන කලාපයෙන් ලැබිය යුතු රු.10,403,683ක් අයකර ගෙන නොතිබුණි.

(iii) 1999 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වෙනත් ණයගැතියන් දොළහක එකතුව රු.4,441,903 සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

(iv) මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන DHPL ගොඩනැගිල්ල සඳහා වූ වාර්ෂික කුලිය රු.60,750,000ක් වුවද වාර්ෂික අයවැය පිළියෙළ කිරීමේ දී රු.12,750,000ක් අඩුවෙන් සඳහන් කිරීමත් ඉකුත් වර්ෂයේදීද භාණ්ඩාගාරයෙන් අඩුවෙන් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම නිසාත් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු.30,375,000ක් විය.

**(ආ) අරමුදල් ඌන උපයෝජනය**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති නමුත් 2018 වර්ෂය තුළ දී ක්‍රියාත්මක නොකරන ලද වැඩසටහන් 16 ක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා ප්‍රතිපාදිත මුදල රු.මිලියන 15.25ක් විය. මෙම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට හේතු ලෙස ප්‍රසම්පාදන කමිටු තීරණ ප්‍රමාදය සහ පිරිවැය ගැටළු බව දක්වා තිබුණි.

(ඇ) කළමනාකරණ හා මෙහෙයුම් අකාර්යක්ෂමතාව

(i) මණ්ඩලය සමාගම් 35 ක සමානා කොටස්වල හා සමාගම් 29 ක වරණිය කොටස්වල ආයෝජනය කර ඇති අතර 2018 දෙසැම්බර් 31 දිනට එම ශේෂයන් පිළිවෙළින් රු. 58,312,483ක් හා රු. 105,066,208 ක් විය. සමාලෝචිත වර්ෂයේ දී ඉන් සමාගම් තුනක පමණක් සාමානා කොටස් මත සිදුකර තිබූ රු.14,418,550 ක ආයෝජනය මත රු.3,952,557ක ලාභාංශ ලැබී තිබූ අතර ඉතිරි සාමානා කොටසවල ආයෝජන කළ සමාගම්වලින් සහ වරණීය කොටස් මත සිදු කර තිබූ සමාගම් 29 ක ආයෝජනයෙන් කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි. තව ද මෙම ආයෝජන වලින් එකතුව රු. 17,315,000 ක් ආයෝජනය කර තිබූ සමාගම් 3 ක් 2002, 2007 සහ 2009 යන වර්ෂ වලදී විසුරුවා හැර තිබූ අතර ඇවරකරු විසින් කොටස් වල ආයෝජිත මුදල් ආපසු ගෙවීමට වත්කම් නොමැති බව දක්වා තිබුණි. තවද සමාගම් ලියාපදිංචි නාම ලේඛනයෙන් කපා හැර තිබූ සමාගම් 25 ක ආයෝජනය කර තිබූ රු. 58,587,917ක් ද අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර මණ්ඩලය විසින් ආයෝජන කාලානුරූපව සමාලෝචනය කර ඇතිවිය හැකි ප්‍රාග්ධන අලාභ වළක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2018 මැයි 14 දින සිට මැයි 17 දින දක්වා නෙදර්ලන්තයේ පැවැත්වූ අපනයන ප්‍රවර්ධන වැඩ සටහන යටතේ අපනයනකරුවන් 25 දෙනෙකු සහභාගි කරවීමට රු.මිලියන 6.8 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් රු.මිලියන 4.5 ක් වැය කර සහභාගී කර තිබුණේ 19 දෙනෙකු පමණක් වූ අතර සහභාගී වූ අයගෙන් 08 දෙනෙකු අපනයන වෙළඳපළේ කොටස් හිමි කර ගැනීමට නොහැකි වූ බවත් ඊට සහභාගී වීමෙන් තම අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වූ බවත් ඔවුන් ඉදිරිපත් කළ කාර්යසාධන වාර්තාවලින් පෙන්නුම් කර තිබුණි. තවද ප්‍රදර්ශනයට සහභාගී වූවන් විසින් සපුරාලිය යුතු හා අත් කරගත යුතු ප්‍රගතිය පිළිබඳ මණ්ඩලය අතර ගිවිසුමකට එළඹී නොතිබුණි.

(iii) 2014 ජුලි 11 දිනැති අති විශේෂ ගැසට් අංක 1870/71 මහින් ජාතික කාබනික පාලන ඒකකයක් මණ්ඩලයේ ස්ථාපිත කර තිබූ අතර වසර 3ක් ගත වීමෙන් පසු එනම් 2017 අගෝස්තු 31 දිනැති අංක 2017/8/74 දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අනුව රු.750,000ක් ගෙවීමේ පදනම යටතේ ඒ සඳහා උපදේශකවරයෙකු බඳවා ගෙන තිබූ අතර අදාල ගිවිසුමේ ප්‍රකාරව රු.750,000ක් ගෙවා තිබුණි. තව ද ජාතික කාබනික ඒකකය ස්වාධීන ඒකකයක් ලෙස පවත්වා ගතයුතු බව ගැසට් නිවේදනයේ සඳහන් කර තිබුණ ද මෙය කෘෂි ඒකකය යටතේ පවත්වාගෙන ගොස් තිබුණි. තව ද උපදේශනාත්මක කමිටු හා තාක්ෂණික කමිටුව කාර්තුවකට වරක් රැස්විය යුතු වුව ද සමාලෝචිත වර්ෂයේ දී එක් උපදේශනාත්මක රැස්වීමක් පමණක් පවත්වා තිබුණද තාක්ෂණික කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. තවද 2017 වර්ෂයේ රු.155,149ක් ද 2018 වර්ෂයේ දී 136,149ක් මේ

වෙනුවෙන් වැය කර තිබූ අතර අයදුම් පත්‍ර 100ක් ලැබී තිබුණද කිසිම ආයතනයකට ලියාපදිංචි වීම් සහතික නිකුත් කර නොතිබුණි.

(iv) මැද පෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපවල ආහාරපාන සඳහා ඇති වෙළඳපළ කොටස් වර්ධනය කර ගැනීමේ අරමුණින් 2018 පෙබරවාරි 18 සිට 22 දක්වා පැවැති Gulf Food වෙළඳ ප්‍රදර්ශනයට රු.මිලියන 11.67 ක් වැයකර සමාගම් 24 ක් සහභාගී කරවා තිබූ අතර ඉන් සමාගම් 09 ක අපනයන ප්‍රමාණය සියයට 1 සිට සියයට 51 දක්වා පිරිහී තිබුණි.

(v) මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන සම්බන්ධ වෙළඳ ගනුදෙනු වැඩි කිරීමේ අරමුණින් 2018 අප්‍රේල් 24 දින සිට අප්‍රේල් 26 දින දක්වා බෙල්ජියමේ බ්‍රසල් හි පැවැති (සී ෆුඩ් එක්ස්පෝ ගෝල්ඩ්) වෙළඳ ප්‍රදර්ශනයට අපනයනකරුවන් 09 දෙනෙකු සහභාගී කරවා තිබූ අතර ඉන් සමාගම් 5ක් සඳහා සිව් වතාවකට වැඩි වාර ගණනක් අනුග්‍රහය ලබා දී තිබුණි. ඒ අනුව නවක අපනයනකරුවන්ට අවස්ථාව ලබා දීම කෙරෙහි මණ්ඩලය අවධානය යොමුකර නොතිබුණි. තව ද එක්වරක් පමණක් සහභාගී වූ අපනයනකරුවන්ට ප්‍රදර්ශන බිම් කුලිය හා ප්‍රදර්ශන කුටි පිරිවැය සඳහා සියයට 100 ක අනුග්‍රහයක් සැපයිය යුතු වුවත් එවැනි සමාගම් 2 ක් සඳහා සියයට 50 ක අනුග්‍රහයක් ලබා දී තිබුණි. එසේ ම ප්‍රදර්ශනයට සහභාගී වූ සමාගම් 5 ක් අපනයන ප්‍රමාණය ඉකුත් වර්ෂය සහ සැසඳීමේ දී සියයට 5 සිට සියයට 52 දක්වා අඩු වී තිබුණි.

(vi) 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය 272 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 224 ක් වූයෙන් තනතුරු 48 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක්ද කනිෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක්ද පහළ මට්ටමේ තනතුරු 11 ක්ද පුරප්පාඩුව පැවතිණි.

ඩබ්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති